CM 038910—4th rd (KT) T-01

2022 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂ අංකය : 233

අංක 31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල
www.analyst.gov.lk
govanalyst@sltnet.lk

දීපිකා සෙනෙවිරත්න

ආණ්ඩුවේ රස පරීක්ෂක

පටුන

පිටු අංකය

පරිච්ඡේදය 01 - ආයතනික තොරතුරු 01

1.1 හැඳින්වීම 01
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණ 02
1.3 ප්‍රධාන කාර්යයන් 03
1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 04
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 05
1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති විස්තර 08

පරිච්ඡේදය 02 - දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය 09

පරිච්ඡේදය 03 – 2022/12/31 දිනට සමස්ත මූල්‍ය කාර්ය සාධනය 22

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 22
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 24
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 25
3.4 මූල්‍ය ප්‍රකාශන වලට සටහන් 26
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 27
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 27
3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම 27
3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය 27
3.9 විගණකාධිපති වාර්තාව 28

පරිච්ඡේදය 04 - කාර්යසාධන ඉලක්ක 40

පරිච්ඡේදය 05 - සුහුරු සංවර්ධන ඉලක්ක 41

පරිච්ඡේදය 06 - මානව සම්පත් කළමනාකරණය 42

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය 42
6.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත 42
6.3 මානව සම්පත් කළමනාකරණය 43

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 49

01
පරිච්ඡේදය

ආයතනික තොරතුරු

1.1 හැඳින්වීම

වර්ෂ 1904 සැප්තැම්බර් මාසයේ ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව එක් නිලධාරියෙකු සමඟ ආරම්භ කරනු ලැබූ ආණ්ඩුවේ රස පරීක්ෂක ආයතනයේ ප්‍රථම රස පරීක්ෂකවරයා ලෙස බ්‍රිතාන්‍ය ජාතික කේ. සී. බ්‍රවුනින් මහතා ඉතිහාසයට එක්වේ.

ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව පැවති මෙම ආයතනය වර්ෂ 1913දී රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත විය. දෙපාර්තමේන්තුවක් ලෙස විකාශනය වෙමින් පැවැති මෙම ආයතනය, වර්ෂ 1934 දී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පැවැති ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කරන ලදී.

ආරම්භයේ සිටම විදේශීය ප්‍රධානීන් යටතේ පැවැති මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික රස පරීක්ෂකවරයා ලෙස ඩබ්.ආර්. වන්මුගම් මහතා 1945 දී පත්විය. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යයන් පුළුල් කරමින් 1935දී සැක කටයුතු ලේඛණ පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර 1940දී ප්‍රථම සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස තම්බයියා නාගේන්ද්‍රන් මහතා පත්විය.

වර්ෂ 1960දී ආරක්ෂක අමාත්‍යාංශය යටතේත්, 1978 දී අධිකරණ අමාත්‍යාංශය යටතේත් ක්‍රියාත්මක වෙමින් පැවැති මෙහි ප්‍රථම කාන්තා රස පරීක්ෂකවරිය ලෙස 1993 දී යෝගරාණී මහේසන් මහත්මිය ඉතිහාසයට එක්විය.

විද්‍යාගාරයක් සඳහා උචිත නොවන ගොඩනැගිල්ලක ගැටලු රාශියකට මුහුණ දෙමින් වර්ෂ සියයකට අධික කාලයක් කොළඹ නිදහස් චතුරශ්‍රයේ පැරණි ගොඩනැගිල්ලක පැවැති රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, 2013 වර්ෂයේදී බත්තරමුල්ල, පැලවත්තේ ඉදි කරන ලද මහල් 06ක් සහිත නව විද්‍යාගාර හා කාර්යාල සංකීර්ණයකින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී.

නවීන අංගෝපාංග වලින් සමන්විත නව විද්‍යාගාරය ස්ථාපිත කිරීම හා සමගාමීව නව තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීමට හැකිවීම, අපරාධ යුක්තිය ඉටුකිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක විශ්ලේෂණ කාර්යක්ෂම ලෙස ඉටුකිරීමට මහඟු පිටිවහලක් විය.

එසේම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීමේදී අධිකරණ විද්‍යා අංශයට අත්‍යවශ්‍යව පැවැති DNA තාක්ෂණය මෙරටෙහි ස්ථාපිත කිරීමෙහිලා ශ්‍රී ලංකා රජය හා USAID ව්‍යාපෘතිය හා එක්ව DNA විද්‍යාගාරයක් 2013 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලෙහි ආරම්භ කරන ලදී.

කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (KOICA) මගින් ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිය මගින් 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ DNA විද්‍යාගාරය වැඩි දියුණු කිරීමත්, ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට පරිගණක අපරාධ විමර්ශණ විද්‍යාගාරයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමත්, දෙපාර්තමේන්තුව මගින් අපරාධ යුක්තිය පසිඳලීම සඳහා සපයන විද්‍යාත්මක සාක්ෂි, තවදුරටත් සළුලදායී කිරීම සඳහා ලැබුණු සුවිශේෂී පියවරකි.

මේ අයුරින් ලබාගන්නා ලද විද්‍යාත්මක විශ්ලේෂණ වල ඉහළ ගුණාත්මකභාවය තුළින් 2016 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර සඳහා ISO 17025 අන්තර්ජාතික ප්‍රතිතකරණය ලබාගත හැකි විය. වර්ෂ 1904 දී එක් නිලධාරියෙකුගෙන් ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් නිලධාරීන් 121ක් පමණ සේවය කරන අතර 21 වන රස පරීක්ෂකවරිය ලෙස දීපිකා සෙනෙවිරත්න මහත්මිය පත්වී ඇති අතර 7 වන සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක (වැඩ බලන) ලෙස ජේ. එම්. ආර්. ජයසුන්දර මහතා පත්විය.

මෙම දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක යටතේ ක්‍රියාත්මක වන අතර නිහඬ වූත්, අභිමානවූත් සේවයක් ශ්‍රී ලංකාව තුළ සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩ නැංවීම වෙනුවෙන් ඉටුකරනු ලබයි.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

සාධාරණ සහ නීතිගරුක සමාජයක් ගොඩනැගීම

මෙහෙවර

අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට
අධිකරණ විද්‍යා සහ ආහාර විද්‍යා ක්ෂේත්‍රයන්
සම්බන්ධ විද්‍යාත්මක විශ්ලේෂණ, විශේෂඥ සහ උපදේශන සේවාවන් සැපයීම

අරමුණ

කාර්යක්ෂම සහ සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ
ක්‍රියාවලියට දායක වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ ඇති එකම රජයේ අධිකරණ විද්‍යා විද්‍යාගාරය වේ. ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය හා ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය හා මනෝවර්තක, මස්තු විද්‍යා හා DNA, ධූලක විද්‍යා, සැකකටයුතු ලේඛන, පරිගණක ඩිජිටල් අපරාධ විමර්ශන සහ විවිධ නඩු භාණ්ඩ යනුවෙන් ප්‍රධාන අංශ අටකින් අධිකරණ විද්‍යා අංශය සමන්විත වේ.

මෙම දෙපාර්තමේන්තුව සේවාවන් සඳහා වෙන්වූ ආයතනයක් වන අතර, අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය, වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මගින් යොමු කරනු ලබන නඩු භාණ්ඩ හා වෙනත් ආදර්ශ හා සාම්පල් විද්‍යාත්මක පරීක්ෂණයන්ට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදුකරනු ලබයි. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ජලය ආශ්‍රිත ආදර්ශවල තත්වය පරීක්ෂා කර වාර්තා ලබාදීම සිදු කරනු ලබයි. තවද අධිකරණ මගින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛණ පරීක්ෂා කර වාර්තා කිරීම සැක කටයුතු ලේඛණ අංශය මගින් සිදු කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත, ආහාර හා ඖෂධ පනත, ජාතික පාරිසරික පනත, සුරාබදු ආඥා පනත, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පළිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිණිඅවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ පනත, මෝටර් වාහන පනත, බුද්ධිමය දේපල පනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

තවද දිවයිනේ සිදුවන මීනී මැරුම්, ස්ත්‍රී දූෂණ, වෙඩි තැබීම් ආදී දරුණු ගණයේ අපරාධ සහ පිපිරීම්, ගිනි ගැනීම්, මාරක රිය අනතුරු සම්බන්ධ අපරාධ ස්ථාන විමර්ශණයන් සඳහා නිලධාරීන්ගේ විශේෂඥ සහාය පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදේ. මීට අමතරව දේශීය හා විදේශීය ප්‍රභූන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ආහාර පරීක්ෂාව සිදු කරනු ලබන්නේ ධූලක විද්‍යා (වස විෂ) අංශය මඟිනි.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද රස පරීක්ෂක වාර්තා සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් අධිකරණයේදී විශේෂඥ සාක්ෂිකරුවන් ලෙස දිවයිනේ විවිධ අධිකරණ වලදී විශේෂඥ සාක්ෂි ලබාදෙනු ලැබේ.

මෙවැනි සේවා සැපයීමට අමතරව විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විශේෂඥ නිලධාරීන් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදුකරයි. විශේෂයෙන්ම ආහාර පනත යටතේ පනවනු ලබන රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සෑදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලබාදෙනු ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ, පුපුරන ද්‍රව්‍ය හා වෙනත් රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම් වලදී මෙන්ම වෙනත් ආයතනවල අධි තාක්ෂණික උපකරණ මිලදී ගැනීම් වලදී තාක්ෂණික කමිටු වලට තාක්ෂණික සහාය ලබාදීමද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

තවද පොලිස් නිලධාරීන්, අපරාධ පරීක්ෂණ නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ ආධුනික නීතීඥයන්ට හා අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඔවුන්ගේ අධිකරණ විද්‍යාත්මක හා ආහාර විද්‍යාත්මක දැනුම ප්‍රවර්ධනය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් විසින් දේශන, පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යූහය



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අධිකරණ විද්‍යා අංශය

මෙම අංශය යටතේ පහත සඳහන් විශ්ලේෂණ රසායනාගාර පවතී.

1. ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා රසායනාගාරය

ගිනිඅවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය විසින් විවිධ වර්ගයේ ගිනි අවි එනම් රයිපල, පිස්තෝල, පතරොම් තුවක්කු, කොටන තුවක්කු සහ පතරොම් වර්ග ලහ තබා ගැනීමකදී, මෙවා අපරාධ සඳහා යොදා ගත් බවට සැක කරන අවස්ථා වලදී ඒවා පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලබයි. ගිනි අවි භාවිතා කොට සිදු කරනු ලබන අපරාධ පිළිබඳව අන්වීක්ෂීය සැසඳුම් පරීක්ෂණ සිදුකරමින් විද්‍යාත්මකව විමර්ශණය කිරීම මීට ඇතුළත් වේ. ඒ සඳහා අපරාධ වලදී භාවිතා කරන ලද ගිනිඅවි, ගිනි අවි වල කොටස්, විවිධ පතරොම් වර්ග, වැයවූ පතරොම් කොපු හා උණ්ඩ ආදිය පරීක්ෂා කරනු ලැබේ. තවද වෙඩි තැබීම් වලට ලක්වූ මෝටර් රථ, ගොඩනැගිලි ආදියද පරීක්ෂාවට ලක්කරන අතර කුමන ගිනි අවියක් අදාළ අපරාධ සඳහා භාවිතා කළේද යන්න පිළිබඳ විශේෂඥ මතයන් ඉදිරිපත් කරනු ලැබේ.

2. පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි විමර්ශන රසායනාගාරය

මෙම අංශය මගින් බෝම්බ පිපිරීම්, පුපුරණ ද්‍රව්‍ය හා පිපිරුම් උපක්‍රම (බෝම්බ) යමෙක් තම සන්තකයේ තබා ගැනීම් ඇතුළු පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර සිදුකරන අපරාධ වලට අදාළ නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සන්තකයේ තබා ගැනීමේදී අත් අඩංගුවට ගන්නා ලද විවිධ වර්ගයේ පිපිරුම් උපක්‍රම (දේශීය හා විදේශීයව) නිෂ්ක්‍රීය කිරීමෙන් පසු, ඒවායේ කොටස්ද මෙම නිලධාරීන් විසින් විශ්ලේෂණයට භාජනය කරනු ලබයි. එමෙන්ම දේපළ, ගොඩනැගිලි හා වාහන ආදිය ගිනිගැනීම් වලදී පොලිසියට කරනු ලබන පැමිණිලි හා රක්ෂණ වන්දි සඳහා කරනු ලබන ඉල්ලීම අනුව එම ගිනි ගැනීම් පිළිබඳව විමර්ශණය කර ගිනි ගැනීමට හේතුව සම්බන්ධයෙන් මතයන් ඉදිරිපත් කිරීමද මෙම අංශයේ නිලධාරීන්ගේ කාර්යයට අදාළ වේ.

3. මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක රසායනාගාරය

පොලීසිය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, සුරාබදු මත්ද්‍රව්‍ය අංශය හෝ ශ්‍රී ලංකා රේගුව මගින් අත්අඩංගුවට ගනු ලබන අන්තරාදායක ඖෂධ හා මනෝවර්තක යටතට ගැනෙන හෙරොයින්, මෝර්ෆින්, අබිං, ගංජා සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, කොකේන්, මෙත්ඇම්ෆිටමීන් සහ එම කාණ්ඩයට අයත් මත්ද්‍රව්‍ය සහ New Psychoactive Substances (NPS) ගණයට වැටෙන මත්ද්‍රව්‍ය රසායනිකව හඳුනාගැනීම හා ඒවාහි ක්‍රියාකාරී සංඝටකවල සංශුද්ධතාව විශ්ලේෂණය කර අධිකරණය වෙත වාර්තා කිරීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි. එමෙන්ම අවශ්‍ය අවස්ථාවලදී මත්ද්‍රව්‍ය රඳවාගත් ස්ථාන, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලැබීයැයි සැකකරන ස්ථාන සහ මත්ද්‍රව්‍යය ප්‍රවාහනයට යොදාගත් වාහන ආදිය පරීක්ෂා කිරීමට පොලීසියට අවශ්‍ය විශේෂඥ සහාය ලබාදේ.

4. අධිකරණ මස්තු විද්‍යා සහ ඩී.එන්.ඒ. රසායනාගාරය

විවිධ දරුණු අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ලබා ගන්නා ජීව විද්‍යාත්මක ද්‍රව්‍යය මෙන්ම, ජීව විද්‍යාත්මක මව, පියා සහ දරුවන් යන මෙම පාර්ශ්ව අතර සම්බන්ධතාවය තහවුරු කර ගැනීම සඳහා මිනිස් ශරීරයේ ශාරීරික ජෛව තරල හා දත් ඇතුළු ඕනෑම ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් අනුසාරයෙන් පරීක්ෂණ කටයුතු සිදු කර, ඩී.එන්.ඒ. තාක්ෂණය ආශ්‍රයෙන් වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

එමෙන්ම සංකීර්ණ මිනීමැරුම් සහ අපරාධ ස්ථානවල වූ රුධිර පැල්ලම්, කෙස්, ලේ විසිරීම් රටා ආදී ජීව විද්‍යාත්මක සාක්ෂි පරීක්ෂා කර, විශ්ලේෂණයෙන් අනතුරුව වාර්තා නිකුත් කිරීමද මෙම අංශයේ රාජකාරී වලට අයත් වේ.

මීට අමතරව වාහන අනතුරු වලට අදාළ වන වාහන අනතුරු වූ ස්ථාන සහ අදාළ අනෙකුත් සාක්ෂි විද්‍යාත්මකව පරීක්ෂා කර එම අනතුරු ප්‍රති නිර්මාණය කර අවශ්‍ය වැදගත් සාක්ෂි සොයා ගැනීම මෙම අංශයේ විශේෂඥයින්ගේ වගකීමකි.

5. අධිකරණ ධූලක විද්‍යා රසායනාගාරය

අධිකරණ ධූලක විද්‍යා අංශයේ සිටින විශේෂඥයන් විසින් අධිකරණ වෛද්‍ය කාර්යයන් හා අපරාධ විමර්ශන සඳහා වස වර්ග හඳුනා ගැනීම පිණිස විශ්ලේෂණ කටයුතු රාශියක් සිදු කරනු ලැබේ. අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් හෝ අධිකරණය විසින් භාරදෙනු ලබන සැක සහිත සහ හදිසි මරණවලට භාජනය වූ තැනැත්තන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණවලදී ලබාගත් ශරීර කොටස් හා ආදර්ශ, මත්ද්‍රව්‍ය සහ අනෙකුත් වස වර්ග වන සයනයිඩ්, පලිබෝධ නාශක වර්ග, විබාදක අම්ල වර්ග සහ කාබන් මොනොක්සයිඩ් වැනි අහිතකර රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණය කිරීම, බීමත්ව රිය පැදවීම සැක කරන අවස්ථාවලදී සහ මාරක රිය අනතුරුවලදී මත්පැන් හෝ වෙනත් ඖෂධ භාවිතා කර තිබේදැයි හඳුනා ගැනීම සඳහා පුද්ගලයින්ගේ රුධිරය සහ මුත්‍රා සාම්පල විශ්ලේෂණය කිරීම, අපරාධ ස්ථානයෙන් සොයාගත් අධිකරණ විද්‍යාත්මකව වැදගත් භෞතික සාක්ෂි (ඖෂධ පෙති, වස බෝතල, ඉතිරි වූ ආහාර ද්‍රව්‍ය ආදිය) ද මත්ද්‍රව්‍ය, විෂ වර්ග සහ අම්ල වර්ග හඳුනා ගැනීම සඳහා රසායනික විශ්ලේෂණ මෙම අංශය මගින් සිදුකෙරේ.

6. අධිකරණ විද්‍යාත්මක සැකකටයුතු ලේඛන විද්‍යාගාරය

අධිකරණමය හා නීතිමය කටයුතු සඳහා අවශ්‍ය වන සැක සහිත ලිපි ලේඛන සහ ඒවා නිපදවීමට භාවිතා කරන ලද ද්‍රව්‍ය මෙම අංශය මගින් පරීක්ෂාවන්ට ලක්කෙරේ.

සියලු වර්ගවල සැක කටයුතු ලේඛන, අත්අකුරු සහ අත්සන් ආදිය මෙම අංශයේදී ඒවායේ නිර්ව්‍යාජභාවය සඳහා පරීක්ෂා කරනු ලැබේ. තවද අපරාධවලට මෙන්ම සිවිල් නඩුවලට අදාළ ලේඛනවල තිබෙන වෙනස් කිරීම්, මැකීම්, විකෘති කිරීම්, එකතු කිරීම් සහ ආදේශ කිරීම් ආදිය හඳුනාගැනීම, ගමන් බලපත්‍ර, වීසා, ලිවීමේ උපකරණ, තීන්ත, කඩදාසි සහ අලවන ද්‍රව්‍ය, පිළිස්සුණු සහ විකෘති කරන ලද ලේඛන, ව්‍යාජ මුදල් නෝට්ටු, ලොතරැයිපත්, ආදායම් මුද්දර, තැපැල් මුද්දර සහ රජයේ ආදායමට සම්බන්ධ වෙනත් යම් ලේඛන පරීක්ෂා කර ඒවායේ නිර්ව්‍යාජ බව හෝ අදාළ වෙනත් නිගමනයන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ඉදිරිපත් කිරීම මෙම අංශයේ විශේෂඥ නිලධාරීන්ගේ කාර්යභාරය වේ.

7. පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය

මෑතකදී ස්ථාපිත කර ඇති ඩිජිටල් අපරාධ විශ්ලේෂණ අංශය මූලික ලෙස ඩිජිටල් දත්ත විශ්ලේෂණය, ඩිජිටල් ඡායාරූප විශ්ලේෂණය, කටහඬ හා ශබ්ද විශ්ලේෂණය හා ජීවමිතික ලක්ෂණ විශ්ලේෂණය යන මූලික අංශ 4ක් යටතේ විශ්ලේෂණ කටයුතු සිදුකරනු ලබයි.

පරිගණක, ජංගම දුරකථන, CCTV, DVR යන්ත්‍ර ආදී ඩිජිටල් උපාංග තුළ අන්තර්ගත දත්ත විශ්ලේෂණය හා ඒවායේ මකා දමා ඇති දත්ත ප්‍රතිඋත්පාදනය, CCTV වීඩියෝ දත්ත විශ්ලේෂණය, ජීවමිතික ලක්ෂණ ඇසුරින් CCTV දර්ශන වල හා ඩිජිටල් උපකරණවල දර්ශනය වන පුද්ගලයින්ගේ මුහුණු හඳුනා ගැනීම, CCTV දර්ශනවල ඇතුළත් අපැහැදිලි වාහන ලියාපදිංචි අංක තහඩු හඳුනා ගැනීම, ඩිජිටල් ඡායාරූප හා වීඩියෝ පට වැඩි දියුණු කිරීම විශ්ලේෂණය හා වෙනස් කිරීම්වලට ලක්කර ඇතිද යන්න හඳුනා ගැනීම සහ කටහඬ විශ්ලේෂණය මගින් පටිගත කරන ලද සංවාදයන්හි මිනිස් කටහඬෙහි අනන්‍යතාවය තහවුරු කිරීම ආදී විශ්ලේෂණ මෙහිදී සිදු කරයි.

8. විවිධ නඩු භාණ්ඩ විශ්ලේෂණ විද්‍යාගාරය

විවිධ නඩු භාණ්ඩ අංශයේ සිටින අධිකරණ විද්‍යා විශේෂඥයින් විසින් අනිකුත් විෂයයන් යටතේ නිශ්චිතව වර්ගීකරණය කිරීමට නොහැකි අන්‍යාකාර වූ භෞතික සාක්ෂි පරීක්ෂාවට භාජන කරනු ලැබේ. සැක කටයුතු වාහන වල චැසි අංක සහ එන්ජින් අංක පරීක්ෂා කිරීම සහ ඒවා සත්‍යද, වංචනිකද, යන්න නිගමනය කිරීම හා බද්ධ කරන ලද වාහන හඳුනා ගැනීම එක් උදාහරණයකි. තවද අපරාධවලට සම්බන්ධ විවිධ වර්ගයේ ස්පර්ශ සාක්ෂි හා භෞතික සාක්ෂි උදාහරණ වීදුරු කැබලි, තීන්ත පතුරු, කෙඳි වර්ග, පස්, ආයුධ, ආයුධ සලකුණු (ඇඟිලි සලකුණු හැර), ලාංඡන ආදිය සඳහා විද්‍යාත්මක පරීක්ෂණ හා විවිධ තාක්ෂණික උපකරණ භාවිතා කරමින් කරනු ලබන පරීක්ෂණ මෙන්ම රසායනික විශ්ලේෂණ ක්‍රම මගින් හඳුනා ගැනීම සහ සංසන්දනය මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

ආහාර විද්‍යා අංශය

1. ආහාර විශ්ලේෂණ රසායනාගාරය

1980 අංක 26 දරන ආහාර පනත යටතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ආහාර පරීක්ෂකවරුන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්) විසින් ඉදිරිපත් කරනු ලබන ආහාර සාම්පල, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන, විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ආහාර පාලන ඒකකය, අනෙකුත් රජයේ ආයතන සහ පුද්ගලික ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන එවැනි ආහාර සාම්පල විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම හා රේගු දෙපාර්තමේන්තුව, පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආදී ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ජාතික පාරිසරික පනත යටතේ ආණ්ඩුවේ විවිධ ආයතන සහ සංස්ථා සඳහා පානීය ජලය සහ කර්මාන්ත අප ජලය විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

2. මද්‍යසාර විශ්ලේෂණ රසායනාගාරය

අධිකරණය මගින් විශ්ලේෂණය සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන නීති විරෝධී මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදන විශ්ලේෂණය කර සුරා බදු ආඥාපනත යටතේ අධිකරණය වෙත වාර්තා නිකුත් කිරීම සහ සුරාබදු දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබන දේශීය සහ විදේශීය මත්පැන් සඳහා තත්ත්ව වාර්තා නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වන කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීම සඳහා අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය වන අරමුදල් රැස්කිරීම සහ ඒවා කාර්යක්ෂමව, ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් මෙහෙයවීම තුළින් මූල්‍ය කළමනාකරණය කිරීම හා ඊට සම්බන්ධ ගිණුම් කටයුතු පවත්වාගෙන යාමද, මූල්‍ය තොරතුරු අවශ්‍ය වෙනත් පාර්ශවයන් වෙත ලබාදීමද මූල්‍ය අංශයේ වගකීම වේ.

එම කටයුතු කර ගෙන යාමේදී,

- කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය උපදෙස් හා මග පෙන්වීම
- ආයතනය සතු වත්කවල ආරක්ෂාව තහවුරු කිරීම
- රාජ්‍ය මුදල් රෙගුලාසි හා චක්‍ර ලේඛ විධිවිධානවලට අනුකූලව මූල්‍ය පරිහරණය කිරීම
- ගිණුම්කරණය හා වාර්තා කිරීම යනාදී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

ආයතන අංශය

දෙපාර්තමේන්තුව තුළ ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම, මානව සම්පත් කළමනාකරණය, පුහුණු කිරීම් සහ කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය මෙම අංශය මගින් සිදුකරනු ලැබේ.

1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතියේ විස්තර

ව්‍යාපෘතියේ නම	*ප්‍රදානය කරන රට*	*ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල*	*ව්‍යාපෘතියේ කාලය*
ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ අධිකරණ වෛද්‍ය ඖෂධ විශ්ලේෂණයේ ධාරිතා ගොඩනැගීම ශක්තිමත් කිරීම.	කොරියාව (කොයිකා ව්‍යාපෘතිය)	ඇ. ඩො. මි. 04	2022-2025

02
පරිච්ඡේදය

කාර්යසාධනය සහ අනාගත අභියෝග

විශ්ලේෂණ වාර්තාවල ප්‍රගතිය

වර්ෂයක් තුළ නිකුත් කරනු ලබන විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධනය මැන බැලීමේ ප්‍රධාන දර්ශකය වේ. 2021 වර්ෂයේ ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව 29,355 ක් වන අතර 2022 වර්ෂයේදී ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව 42,895ක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව එය 46% දක්වා වර්ධනයකි. තවද 2022 වර්ෂය තුළ නිකුත් කළ විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව 40,756ක් වූ අතර එය 2021 වර්ෂයට සාපේක්ෂව 12%ක වැඩි වීමකි. (2021 වසරේ නිකුත් කළ විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව 36,328කි.)

සමස්තයක් ලෙස ගත් කල වැඩිම නඩු සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශයට වන අතර ඊට අනුව වැඩිම වාර්තා ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ ද එම අංශයෙනි.

	2021	2022
ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව	13,358	20,798
වාර්තා කළ නඩු භාණ්ඩ සංඛ්‍යාව	17,841	16,479

2020-2022 වසර තුළ රට මුහුණ දී තිබුණ කොවිඩ් වසංගත ව්‍යාප්තිය හා ආර්ථික අභියෝග රැසක් මධ්‍යයේ වුවද දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ වෙහෙස මහන්සිය හා කැපවීම තුළින් කාර්යක්ෂම හා සඵලදායී සේවයක් ලබාදීම සම්බන්ධයෙන් ඔවුන්ට ගෞරවය හා ප්‍රශංසාව හිමිවිය යුතුය.

අංශය	විද්‍යාගාරය	**2022.01.01** දිනට නඩු සංඛ්‍යාව	ලැබුණු නඩු සංඛ්‍යාව	වාර්තා කළ නඩු සංඛ්‍යාව	**2022.12.31** දිනට වාර්තා නොකළ නඩු සංඛ්‍යාව
අධිකරණ විද්‍යා ක්ෂේත්‍රය	මත්ද්‍රව්‍ය හා මනෝවර්තක	1,390	20,798	16,479	5,709
	ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා	221	434	441	214
	පුපුරණ ද්‍රව්‍ය හා ගිනි ගැනීම්	163	835	821	177
	අධිකරණ ධූලක විද්‍යා (වස වර්ග)	1,383	2,610	3,102	891
	අධිකරණ මස්තු විද්‍යා	2,567	1,955	1,462	3,060
	සැක කටයුතු ලේඛන	80	721	697	104
	ඩිජිටල් අපරාධ	878	883	808	953
	විවිධ අධිකරණ ද්‍රව්‍ය	365	458	598	225
එකතුව		7,047	28,694	24,408	11,333
ආහාර විද්‍යා ක්ෂේත්‍රය	මත්පැන්	392	7,295	7,091	596
	මධ්‍යසාර හා දුම්කොළ	192	2,953	3,063	82
	ආහාර පනත යටතේ ආහාර සාම්පල	21	5,327	5,177	171
	විවිධ ආහාර වර්ග	48	976	1,017	7
එකතුව		653	16,551	16,348	856
මුළු එකතුව		7,700	45,245	40,756	12,189

විශ්ලේෂණ කටයුතුවලට අමතරව සිදුකරනු ලැබූ කාර්යයන්

කාර්යය	සංඛ්‍යාව
අධිකරණවලදී සාක්ෂි සැපයූ අවස්ථා	දින 317
අපරාධ ස්ථානවලට සහභාගි වූ අවස්ථා	දින 535
ධූලක විද්‍යා අංශයේ නිලධාරීන් සහභාගි වූ විශේෂ ප්‍රහූ සහ රාජ්‍ය තාන්ත්‍රික ආහාර පරීක්ෂණ	නිලධාරි දින 09
දේශන පැවැත්වීම	දින 44
දේශීය පුහුණු	නිලධාරි දින ගණන 1099
විදේශීය පුහුණු	නිලධාරි දින ගණන 12









1. විශ්ලේෂණය අවසන් කරගත නොහැකි වූ නඩු භාණ්ඩ ප්‍රමාණය අඩු කිරීම

වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන නඩු භාණ්ඩ පිළිබඳ වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පුරප්පාඩු පිරවීම අත්‍යාවශ්‍ය වේ. දැනට සහකාර රස පරීක්ෂක නිලධාරීන් 19 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී ඇති අතර විශේෂ අනුමැතියක් මත බඳවා ගැනීමට ඉල්ලුම් කර ඇත. කෙසේ වුවද 2022 වර්ෂය තුළ මතුවූ ඉන්ධන හා ආර්ථික අර්බුදය මත කාර්යාලය වෙත නිලධාරීන් කැඳවීම සීමා කිරීම හේතුවෙන් විශ්ලේෂණය අවසන් කිරීමට නොහැකිවූ නඩු භාණ්ඩ ප්‍රමාණය ඉහළ ගොස් ඇත. තවද නඩු භාණ්ඩ ලැබීම 46% කින් පමණ ප්‍රමාණයකින් ඉහළ යාමද විශ්ලේෂණය අවසන් කිරීමට නොහැකි වූ නඩු භාණ්ඩ ප්‍රමාණය ඉහළ යාමට බලපා ඇත.

දෛනිකව ඉදිරිපත් වන නඩු භාණ්ඩ මෙන්ම ඉහත පරිදි විශ්ලේෂණය අවසන් කිරීමට නොහැකි වූ නඩු සම්බන්ධ කටයුතු නිම කිරීම සඳහා නිලධාරින් අතිකාල සේවයේ යෙදවීම අවශ්‍ය වන අතර සතියේ දිනවල අතිරේක පැය කිහිපයක් සේවය කිරීම මෙන්ම රජයේ නිවාඩු දින වල සේවයේ යෙදවීමටද සිදුවිය.

2. පර්යේෂණ හා සංවර්ධන අංශයක් ස්ථාපිත කිරීම

නවීනතම විද්‍යාත්මක ක්‍රමවේදයන් පිළිබඳ දැනුම දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ඉතා වැදගත් වේ. නව මත්ද්‍රව්‍යයන් හා රසායනිකයන් භාවිතයට එකතුවීම දිනපතා සිදුවන අතර දෙපාර්තමේන්තු නිලධාරින් මෙම තත්ත්වයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් සහිත වීම අවශ්‍ය වේ. මේ සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරින්ට දේශීය මෙන්ම විදේශීය පුහුණු හා පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා ලබාදීම සිදුකළ යුතු ය.

3. අධිකරණ වලින් ඉදිරිපත් කරන ලද සාම්පල ඉවත් කිරීම

රටේ ක්‍රියාත්මක වන අධිකරණ ක්‍රමය තුළදී යම් නඩුවක් සඳහා අවසන් තීරණයක් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් පරීක්ෂණ අවසන් කරන ලද නඩු භාණ්ඩ ඉවත් කර ගැනීම ප්‍රමාද වේ. නඩු භාණ්ඩ ලැබීම අධිකවීම නිසා ඒවා ගබඩා කර තැබීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිකම දැඩි ගැටලුවකි. මේ හේතුවෙන් වාර්තා ඉදිරිපත් කළ නඩු භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් කාලානුරූපීව ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුව ඇත. එබැවින් ගරු අධිකරණ අමාත්‍යාතුමාගේ සහ අමාත්‍යාංශය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මත්ද්‍රව්‍ය සහ අන්තරායකර ඖෂධ ඉවත්කිරීමේ කමිටුවක් පිහිටුවා ඇති අතර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා ද මෙම කමිටුවේ එක් සාමාජිකයෙකි. මේ වන විට පොලිස් නිලධාරින් අධිකරණ නියෝගයන් අනුව නඩුභාණ්ඩ ඉවත් කිරීම සිදුකරනු ලබයි.

4. වීඩියෝ තාක්ෂණ ඔස්සේ විශේෂඥ සාක්ෂි ලබාදීම

දිවයින පුරා පිහිටා ඇති අධිකරණ වළ සාක්ෂි ලබාදීම සඳහා නිලධාරින් සහභාගී කරවීමේදී මතුවන ගැටලු අවම කර ගැනීම සඳහා මාර්ගගත වීඩියෝ තාක්ෂණය මගින් කඩිනමින් සාක්ෂි ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම ඉතාමත් වැදගත් වේ. මෙහි මූලික පියවරක් ලෙස වීඩියෝ තාක්ෂණ උපකරණ කට්ටල දෙකක් අධිකරණ අමාත්‍යාංශය හා UNDP ව්‍යාපෘතිය මගින් අප දෙපාර්තමේන්තුවට ලබාදුන් අතර ඒවා දැනටමත් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇත. කෙසේ වුවද දැනට දුරස්ථ සාක්ෂි ලබාදීම පිළිබඳ පැහැදිලි නීතිමය ප්‍රතිපාදනයක් නොමැති බැවින් ඒ සඳහා අදාළ ආයතන සහ අංශ ක්‍රියාත්මක වී අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සහ අන පනත් කඩිනමින් ස්ථාපිත විය යුතු බව ද පෙන්වා දෙමි.





වීඩියෝ තාක්ෂණය ඔස්සේ විශේෂඥ සාක්ෂි ලබාදීම මේ වන විට ආරම්භ කර ඇත. මෙම ක්‍රමය යටතේ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරින්ට රට පුරා පැතිරුණු විවිධ අධිකරණ වලට තම විශේෂඥ සාක්ෂි ලබාදීම කළ හැකිනම් භෞතිකව සහභාගීවීමට ගත වන කාලය විශාල වශයෙන් ඉතිරි වන නිසා කාලය වඩාත් ඵලදායීව රාජකාරී කටයුතු සඳහා යෙදවීමට හැකිවීම මෙන්ම රජයේ වියදම් ද සාපේක්ෂව අවම කරගත හැකි බව පෙනේ.

5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

දිනෙන් දින වර්ධනය වන නඩු භාණ්ඩ ලැබීම කළමනාකරණය කර ගතහැකි පරිදි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ඵලදායීතාවය වර්ධනය කිරීම කෙරෙහි බලපානු ලබයි. ICTA ආයතනය මගින් අදියර දෙකකින් යුත් ව්‍යාපෘතියක් ලෙස මෙම මෙහෙයුම් මෘදුකාංගයන් ලබාදීමට බලාපොරොත්තු වන අතර පළමු අදියර දැනට සංවර්ධනය කර ඇත. ප්‍රායෝගික ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම මෘදුකාංගය 2022 වර්ෂය තුළදී ස්ථාපනය කිරීමට නොහැකි විය.

6. පරීක්ෂණාගාර වල විශ්ලේෂණ කටයුතු කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීම

ඉදිරිපත් වන සාම්පල හා රසායනාගාර වල තොරතුරු ඵලදායීව හැසිරවිය හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මේ යටතේ අපේක්ෂා කෙරේ.

7. යටිතල පහසුකම් සංවර්ධනය

2022 වර්ෂය තුළ දී දේශීය අරමුදල් හා විදේශ ප්‍රදාන වලින් දෙපාර්තමේන්තුවේ විවිධ රසායනාගාර වෙත ලැබුණු උපකරණ වල ඡායාරූප පහත දක්වා ඇත.

පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය





Gas Chromatography – Mass Spectrometry

UNODC ව්‍යාපෘතිය යටතේ Gas Chromatography – Mass Spectrometry උපකරණය පුපුරණ ද්‍රව්‍ය ගිනි විමර්ශන විද්‍යාගාරය වෙත ලැබී ඇත. පිපිරීමක දී ලැබෙන පිපිරුණු සුන්බුන් වල අඩංගු පුපුරණ ද්‍රව්‍ය වර්ගය හඳුනා ගැනීමට හා ගිනි විමර්ශනයේ දී ලබා ගන්නා ගිනි සුන්බුන් සාම්පල වල ගිනි ගන්නා සුළු වූ ද්‍රව ශේෂ වල අන්තර්ගතය පරීක්ෂා කිරීමට මෙම උපකරණය භාවිතා කරයි.

මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශය

	**Hand-held Raman analyzer** එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යංශය (UNODC) මගින් Hand-held Raman analyzer උපකරණය මත්ද්‍රව්‍යය හා මනෝවර්තක අංශයට ලබා දී තිබේ. මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම, මත්ද්‍රව්‍යයන්හි අඩංගු මිශ්‍ර කිරීමේ ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා මෙම උපකරණය භාවිතා වේ.
	**Gas Chromatography Mass Spectrometry** **(GC-MS 04)** ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) Japan International Co-operation Agency මගින් පරිත්‍යාග කරන ලද මෙම Gas Chromatography Mass Spectrometry උපකරණය මත්ද්‍රව්‍ය වර්ගය ස්ථිරවම හඳුනාගැනීම සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණය සඳහා භාවිතා කෙරේ.
	**Gas Chromatography Mass Spectrometry** **GC-MS 05** ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) Japan International Co-operation Agency මගින් පරිත්‍යාග කරන ලද මෙම Gas Chromatography Mass Spectrometry උපකරණය මත්ද්‍රව්‍ය වර්ගය ස්ථිරවම හඳුනාගැනීම සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණය සඳහා භාවිතා කෙරේ.

අධිකරණ ධූලක විද්‍යා (වස වර්ග)

	GCMS- SHIMADZU ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (JICA) Japan International Co-operation Agency මගින් පොලිස් දෙපාර්තමේන්තුවට ලැබුණ ප්‍රදානයක් වන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් භාර දෙන ලදී. ඖෂධ සහ පළිබෝධනාශක විශ්ලේෂණය
	UHPLC- SHIMADZU ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (JICA) Japan International Co-operation Agency මගින් පොලිස් දෙපාර්තමේන්තුවට ලැබුණ ප්‍රදානයක් වන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් භාර දෙන ලදී. ඖෂධ සහ පළිබෝධනාශක විශ්ලේෂණය
	UV Spectrometer ඖෂධ විශ්ලේෂණය (ඖෂධ පෙති සඳහා විශේෂිතවේ.) ලෝහ වර්ග විශ්ලේෂණය සඳහා colonmetric භාවිතා වේ.

	FAO Project මගින් ලබාදුන් උපකරණයකි. විශ්ලේෂණ කටයුතු සඳහා අවශ්‍ය වන ආහාර සාම්පල (ජාන වෙනස් කළ) පිළියෙල කර ගැනීම සඳහා ලබාදී ඇත. දැනට වෙනත් විශ්ලේෂණ සඳහා අදාළ ආහාර සාම්පල පිළියෙල කර ගැනීම සඳහා ද යොදා ගනී.
	FAO Project මගින් ලබාදුන් උපකරණයකි. විශ්ලේෂණ කටයුතු සඳහා සාම්පල පිළියෙල කිරීමේ දී අවශ්‍ය වන ආහාර සාම්පල කොටස් වල බර මැනීම සඳහා යොදා ගනු ලැබේ.
	ජාන වෙනස් කළ ආහාර සාම්පල විශ්ලේෂණ කටයුතු සඳහා ලබාදුන් උපකරණයකි. දැනට මෙමගින් මාළුවල ෆෝමැල්ඩිහයිඩ් ප්‍රමාණය නිර්ණය කරගැනීම සඳහා ද යොදා ගනී.

 	1. 2-8 ºc Refrigerator (Brand Name -LABFREEZE) For storage samples
	ඩී.එන්.ඒ පරීක්ෂණ කටයුතු සඳහා විවිධ අධිකරණ සහ අධිකරණ වෛද්‍යවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන විවිධ ජෛව විද්‍යාත්මක ද්‍රව්‍ය අඩංගු නඩු භාණ්ඩ සහ සාම්පල ඒවායේ පරීක්ෂණ කටයුතු ආරම්භ කරන තෙක් තත්ත්වයන් ආරක්ෂා කිරීම සඳහා ගබඩාකර තැබීම සිදුකල යුතුය. මේ සඳහා 2-8 ºc දක්වා අඩු උෂ්ණත්ව පරාස වළ සාම්පල සහ නඩු භාණ්ඩ ගබඩා කිරීම කළයුතු අතර මෙම ශීතකරණය ඒ සඳහා ඉතා ප්‍රයෝජනවත් වේ. රු.2,144,175/-
	2. Photo Copy Machine (Multi-functional -Photo copy, Printing, Scan) (Brand-TOSHIBA)
	බහු කාර්ය උපකරණයක් වන අතර නඩු භාණ්ඩ පරීක්ෂා කරන කටයුතු වලදී අදාළ ඡායා පිටපත් ලබාගැනීමට, scan කිරීමේ කටයුතු සඳහා මෙන්ම නඩු භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් අනතුරුව පිළියෙල කරනු ලබන වාර්තාව මුද්‍රණය කිරීමට ද මෙම යන්ත්‍රය භාවිතා කරයි. බහු කාර්යය උපකරණයක් වන බැවින් විද්‍යාගාර කටයුතු වලට මහත් සේ උපයෝගී වේ. රු.97,200/-

මත්පැන් අංශය

	Analytical Balance Model No – AS 220R2 S/N 735446 Manufacturer – RADWG, Poland Local Agent – Analytical Instruments, Colombo 08. සාම්පල කිරා මැන බැලීම 2022.01.18 දින ශ්‍රී ලංකා මුදලින් රු. 31,101,200.01 ක් වැය කර මිලදී ගන්නා ලද්දකි.

	Alcolyzer System (Anton Paar) -02 Model No – DMA 4500M S/N 83660115 Manufacturer - Anton Paar, GMbH, Austria Local Agent – Analytical Instruments, Colombo 08. ආසවනය කළ සහ පැසුණු මත්පැන් වල මධ්‍යසාර ශක්තිය මැන බැලීම. 2022.08.25 දින ශ්‍රී ලංකා මුදලින් රු. 210,700.00 ක් වැය කර මිලදී ගන්නා ලද්දකි.

2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවට විශ්ලේෂණය සඳහා ලැබුණු නඩු භාණ්ඩ අතුරින් සුවිශේෂ සිද්ධීන්

පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය

1. 2022.01.09 දින නුවරඑළිය පොලිස් වසමේ හෝටලයක කාමරයක් තුළ නාන කාමරයේ උණු වතුර ටැංකියක (Hot Water Geyser) සිදුවූ පිපිරීම පිළිබඳ විමර්ශනය
2. 2022.04.19 දින ඉන්ධන මිල ඉහළ යාම නිසා උද්ඝෝෂනයක යෙදුන මහජනතාව විසින් රඹුක්කන පොලිස් වසමේ ඉන්ධන පිරවුම්හල අසල ඉන්ධන රැගත් බවුසරයකට ගිනිතැබීමට තැත් කිරීම සම්බන්ධ විමර්ශනය
3. 2022.05.09 වන දින දිවයින තුළ සිදුවූ මහජන විරෝධතාවලට අදාළව දිවයින පුරා ගිනි තබන ලද නිවාස, කාර්යාල, ගොඩනැගිලි හා රථ වාහන පිළිබඳව නඩු 180ට අදාළ විද්‍යාත්මක ගිනි විමර්ශනය
4. 2022.07.08 දින කොළඹ 15, සී.ජී.වී ඇන්තනී සහ පුත්‍රයෝ පෞද්ගලික සමාගමට අයත් ගොඩනැගිල්ලක් තුළ විධිමත් ලෙස අවබල පුපුරණ ද්‍රව්‍ය සහිත ඇසුරුම් බැහැර නොකිරීම හේතුවෙන් එහි සේවයේ නියුතු පුද්ගලයින් දෙදෙනෙක් හදිසියේ ඇතිවූ පිපිරීමක් හේතුවෙන් මිය යාම සම්බන්ධව විමර්ශනය
5. 2022.07.09 දින ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ නිවසට ගිනි තැබීම සම්බන්ධ විමර්ශනය
6. 2022.09.08 දින කොළඹ 14 ෆර්ගියුසන් පාර, කජීමා වත්ත ලිපිනයේ පිහිටි සමූහ පැල්පත් නිවාස 60කට අධික ප්‍රමාණයක් ගින්නෙන් හානිවීම පිළිබඳ විමර්ශනය
7. 2022.11.04 දින පානදුර නල්ලුරුව රාජකීය ප්‍රාථමික විදුහලේ සිසු සිසුවියන් 44 දෙනෙකු විදුහල අසල නිවසක සිදුකළ ගිනිතැබීමක් හේතුවෙන් නිකුත් වූ දුම ආඝ්‍රහනය කිරීම නිසා ඇතිවූ ස්වසන අපහසුතා හේතුවෙන් රෝහල් ගත කිරීම සම්බන්ධ විමර්ශනය
8. 2022.11.10 දිනැති අළුත්කඩේ මහේස්ත්‍රාත් තුමාගේ නියෝගය පරිදි හොරණ, ගල්කඩේ හංදිය, ගුංගමුව කණිෂ්ඨ විද්‍යාලයේ සිසුන් තිදෙනෙක් හට පොලිස් නිලධාරීන් විසින් විදුලි සැර වද්දවා සිදුකරන ලද තුවාල කිරීම් සම්බන්ධ විමර්ශනය

මත්ද්‍රව්‍ය අංශය

2022 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය රසායනාගාරයට විවිධ මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු භාණ්ඩ 20,777ක ප්‍රමාණයක් ලැබුණු අතර ඉන් වැඩි ප්‍රමාණයක් හෙරොයින්, ගංජා සහ මෙත්ඇම්පිටමීන් සම්බන්ධ නඩු භාණ්ඩයි. ශ්‍රී ලංකාව තුළදී අත්අඩංගුවට ගනුලැබූ විශාල බර ප්‍රමාණ වලින් යුතු (කි.ග්‍රෑ 100 - කි.ග්‍රෑ 400 අතර) හෙරොයින් අඩංගු නඩු භාණ්ඩ (05) ක්, මෙත්ඇම්පිටමීන් අඩංගු නඩු භාණ්ඩ (01)ක් සහ කොකේන් අඩංගු නඩු භාණ්ඩ (01) ක් 2022 වර්ෂයේ දී විශ්ලේෂණය කරනු ලැබීය.

ශ්‍රී ලංකාව තුළ නව ප්‍රවණතාවයක් බවට පත්වෙමින් තිබෙන, නව මනෝවර්තක ද්‍රව්‍ය (New psychoactive substance (NPS)) ගණයට වැටෙන NBOH කාණ්ඩය, කැතීන් යන මත්ද්‍රව්‍යද, ඇම්පිටමීන් හා මෙතලීන් ඩයිඔක්සි මෙත්ඇම්පිටමීන් (MDMA) අඩංගු මත්පෙතිද, ලයිසර්ජික් ඇසිඩ් ඩයිඑතිල්ඒමයිඩ් (LSD) අඩංගු මත් මුද්දරද, 2022 වසර තුළ මත්ද්‍රව්‍ය රසායනාගාරයේදී හඳුනාගෙන විශ්ලේෂණය කර තිබේ.

ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය

2022 වර්ෂය තුළදී ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශයට ලැබුණු පරීක්ෂණ අතුරින් විශේෂිතවූ පරීක්ෂණ කීපයක් පහත දැක්වේ.

1. 2022.04.19 වන දින රඹුක්කන ප්‍රදේශයේදී සිදුවූ වෙඩි තැබීම සම්බන්ධව ස්ථානීය පරීක්ෂාව හා නඩු භාණ්ඩ විශ්ලේෂණය හා වාර්තා නිකුත් කිරීම.
2. 2022.09.08 වන දින නිට්ටඹුව නගරයේ සිදුවූ වෙඩි තැබීම සම්බන්ධ ස්ථානීය පරීක්ෂාව සිදුකිරීම, එම වෙඩි තැබීම සම්බන්ධව නඩු භාණ්ඩ විශ්ලේෂණය හා වාර්තා නිකුත් කිරීම.
3. 2022.08.29 වන දින කොටුව ජනාධිපති මන්දිරය ඉදිරිපිටදී සිදුවූ වෙඩි තැබීම සම්බන්ධව ස්ථානීය පරීක්ෂාව හා වාර්තා නිකුත් කිරීම.
4. දංඹිවිට ප්‍රදේශයේදී ලංගම බස් රථයකට සිදුවූ වෙඩි තැබීම සම්බන්ධව ස්ථානීය පරීක්ෂාව, නඩු භාණ්ඩ විශ්ලේෂණය හා වාර්තා නිකුත් කිරීම.

අධිකරණ විවිධ නඩු භාණ්ඩ විශ්ලේශන අංශය

2022 වසරේදී CM අංශය මගින් අපරාධ ස්ථාන විමර්ශනයට අදාළ මහජනතාව අතර ඇති වැඩි අවධානයක් යොමුවූ පහත සඳහන් අපරාධ ස්ථාන පිළිබඳව විද්‍යාත්මක පරීක්ෂණයන්ට සහභාගී විය.

- 2022 වර්ෂයේ මැද භාගයේ සිදුවූ අරගලය සිදුවීමට අදාළව පරීක්ෂා කරනු ලැබූ ස්ථාන,
    1. ජනාධිපති මන්දිරය
    2. ජනාධිපති කාර්යාලය
    3. අගමැති කාර්යාලය
    4. අරලියගහ මන්දිරය
    5. ඇවන්රා ගාඩන්ස් හෝටල් පරිශ්‍රය - (ගිනිගත් වාහන පිළිබඳ අනන්‍යතා පරීක්ෂණ)
    6. දිවයිනේ අනෙකුත් ස්ථානවල ගිනිගත් වාහන සම්බන්ධ අනන්‍යතා පරීක්ෂණ
    7. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරාල මහතාගේ ඝාතනය හා සම්බන්ධ රථ වාහන හා අදාළ අනෙකුත් නඩු භාණ්ඩ - (අරගලය සිදුවීමට අදාළව රථවාහන 150 පමණ පරීක්ෂා කර ඇත.)
- රුවන්වැලි මහා සෑයේ චූඩාමාණික්‍යය හා සම්බන්ධ විද්‍යාත්මක පරීක්ෂණ කටයුතු
- 2022 වසර අගභාගයේදී සිදුවූ දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ මරණය හා සම්බන්ධ ස්ථානීය විමර්ශනය හා විද්‍යාත්මක විශ්ලේෂීය වාර්තා නිකුත් කිරීම.

සැක කටයුතු ලේඛන අංශය හා ඩිජිටල් හා පරිගණක අපරාධ විශ්ලේෂණ අංශය

2022 වර්ෂයේදී සැක කටයුතු ලේඛන අංශයට හා ඩිජිටල් හා පරිගණක අපරාධ විශ්ලේෂණ අංශයට ලැබුණු නඩු භාණ්ඩ අතුරින් 2022.07.09 දින අරගල සිද්ධිය ඇතුළ පහත සඳහන් සිද්ධීන්ට අදාළ නඩු භාණ්ඩ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර ඇත.

- මහත් ආන්දෝලනයට තුඩු දුන් මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනයට අදාළ 2022 වර්ෂය තුළදී ලබාදෙන ලද ලේඛන පරීක්ෂා කර තීරණාත්මක විද්‍යාත්මක සාක්ෂී සහිත වාර්තාවක් නිකුත් කරන ලදී.
- ඓතිහාසික රඹුක්කන කොටවෙහෙර රජමහා විහාරස්ථානයේ ඉතා වටිනා ධාතු කරඬුව සොරකම් කිරීමට අදාළව වැදගත් විද්‍යාත්මක සාක්ෂි සහිත වාර්තාවක් නිකුත් කරන ලද අතර එමගින් අදාළ අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට හැකිවිය.
- 2022 අරගල සිද්ධියට අදාළ ගිනිතැබීම, පහරදීම්, වෙඩි තැබීම් වැනි අපරාධ වලට අදාළ නඩු භාණ්ඩ රාශියක් ඉදිරිපත් වූ අතර ඒ පිළිබඳව පරීක්ෂණ වාර්තා 100ක් පමණ දැනට නිකුත් කර ඇත. ඒ අතරින් පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරල ඝාතනය, රඹුක්කන වෙඩි තැබීමේදී පුද්ගලයෙක් මිය යාමේ සිද්ධිය වැනි නඩු වලට අදාළ වාර්තා නිකුත් කර ඇත.
- ජනමාධ්‍ය මගින් ප්‍රචාරණය වීමත් සමඟ මහත් ආන්දෝලනයට ලක්වූ කතරගම දේවාලයට පූජා කරන ලද ඉතා වටිනා රන් තැටිය අතුරුදහන් වීම පිළිබඳව වැදගත් විද්‍යාත්මක සාක්ෂි සහිත විශේෂඥ වාර්තාවක් 2022 වර්ෂය තුළ නිකුත් කරන ලදී.
- තවද විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට අනවසරයෙන් ප්‍රවේශ වී දත්ත වෙනස් කිරීම, සොරා ගැනීම සහ අග්‍රහාර අරමුදල් හා කම්කරු දෙපාර්මේන්තු, සේවා නියුක්ති භාර අරමුදල් වලට ව්‍යාජ දත්ත ඇතුළත් කිරීම මෙන්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණක ජාලයට දත්ත ඇතුළත් කිරීම පිළිබඳව අධිකරණ විද්‍යාත්මක සාක්ෂි සහිත වාර්තාව මෙම වසර තුළ නිකුත් කරන ලදී.

අධිකරණ මස්තු විද්‍යා සහ ඩී.එන්.ඒ

පාස්කු ප්‍රහාරය සම්බන්ධව සයින්දමරුදු සමූහ පිපිරුම් ස්ථානයේ පුද්ගල හඳුනා ගැනීම සම්බන්ධයෙන් තෙවන වරට සිදුකරන ලද පරීක්ෂණ වාර්තාව නිකුත් කිරීම.

ආහාර අංශය

ධාන්‍ය සහ ධාන්‍ය ආශ්‍රිත ආහාර වල අඩංගු ඇෆ්ලටොක්සින් ප්‍රමාණය විශ්ලේෂණය

ඇෆ්ලටොක්සින් යනු දිලීර විශේෂයක් මගින් නිෂ්පාදනය කරනු ලබන විෂ වර්ගයක් වන අතර ප්‍රධාන පිළිකාකාරකයක් ලෙස සැලකේ. ඇෆ්ලටොක්සින් බී1, බී2, ජී1, ජී2 ලෙස වර්ග හතරක් ඇති අතර ඒ අතුරින් විෂ බැවින් වැඩි වඩාත්ම අහිතකර ප්‍රතිඵල ගෙන දෙන්නේ ඇෆ්ලටොක්සින් බී1 කාණ්ඩය මගිනි.

ශ්‍රී ලංකාවේ ධාන්‍යමය ආහාර සැකසීම සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය අතර බඩ ඉරිඟු (Yellow Maize, Corn) ප්‍රධාන වේ. දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන බැවින් ආනයනික බඩ ඉරිඟුද මේ සඳහා භාවිතා වේ. මෙම ධාන්‍යමය නිෂ්පාදන ළදරුවන්ට දරුවන්ට සහ ගර්භනී මව්වරුන්ට ලබාදෙන බැවින් ඒවායේ ඇෆ්ලටොක්සින් ප්‍රමාණය පරීක්ෂා කිරීම අත්‍යාවශ්‍ය වේ.

2022 වසරේ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ බඩ ඉරිඟු සාම්පල අතුරින් ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ආහාර අංශය වෙත යොමු කරනු ලැබූ සාම්පල විශ්ලේෂණය කිරීමේදී ලැබුණු ප්‍රතිඵල අනුව 2022 වසරේ ජනවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා ලැබුණු සාම්පල 134න් මුළු ඇෆ්ලටොක්සින් ප්‍රමාණය (බී1+බී2+ජී1+ජී2) සඳහා පැවතිය හැකි උපරිම අගය වන 30ppb ඉක්මවූ සාම්පල ප්‍රමාණය 48%කි. 2022 වර්ෂයේ

නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී ලැබුණු සාම්පල 24 අතරින් 30ppb ඉක්මවූයේ 12%ක සාම්පල ප්‍රමාණයක් පමණි. (දැනට බලාත්මක 1993 ලේබල් හා විවිධ ආහාර ප්‍රමිති රෙගුලාසි 11 කොටස යටතේ වූ පොදු තහනම හා විකිණීම අනුව). ඒ අනුව විශ්ලේෂණ වාර්තා පදනම් කර ගෙන තීරණ ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ආනයනික බඩඉරිඟු වල තත්ත්වය උසස් වීමේ ප්‍රවණතාවයක් දැකිය හැක.

2022 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඇෆ්ලටොක්සින් පරීක්ෂාව සඳහා ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන (Cereals and Cereal Based Products) යොමු කළ සාම්පල 180න් ළදරුවන් සහ ළමයින් සඳහා පැවතිය හැකි මුළු ඇෆ්ලටොක්සින් ප්‍රමාණයේ (බී1+බී2+ජී1+ජී2) උපරිම අගය වන 04 ppb ඉක්මවූ සාම්පල ප්‍රමාණය 60%ක් වේ. එම සාම්පල වලින් 73%ක් ඇෆ්ලටොක්සින් බී1 සඳහා වූ උපරිම අගය වන 02 ppb ඉක්මවා තිබුණි. ඉහත ප්‍රතිශත අගයන් ගණනය කිරීමේදී ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිති රෙගුලාසි 1036 : 2020 (Specialication for Processed Creal – Based foods for infants and young children) හි සඳහන් උපරිම අගයන් පදනම් කර ගෙන වාර්තා කරන ලදී. එහෙත් දැනට බලාත්මක ආහාර හා ප්‍රමිති රෙගුලාසි (1993) අනුව අවුරුදු 1 සිට අවුරුදු 3 දක්වා දරුවන්ට නියමිත ඕනෑම ආහාරයක් සඳහා තිබිය හැකි මුළු ඇෆ්ලටොක්සින් අගය 01 ppb නොඉක්මවිය යුතුය. එමෙන්ම ඒ යටතේ ඕනෑම වයස් කාණ්ඩයක් සඳහා ආහාරයක තිබිය හැකි මුළු ඇෆ්ලටොක්සින් ප්‍රමාණය 30 ppb නොඉක්මවිය යුතුය. ඒ අනුව විශ්ලේෂණය කරන ලද මුළු ධාන්‍ය ආශ්‍රිත ආහාර සාම්පලවලින් 04%ක් එම අගයද ඉක්මවා තිබුණි.

ධාන්‍ය හා ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන හැරුණු විට ආනයනික වියළි මිරිස් වළ අනෙකුත් මිරිස් සාම්පල වළද පොල් තෙල්, ගම්මිරිස්, රටකජු යනාදී ආහාර වළද ඇෆ්ලටොක්සින් ප්‍රමාණය සෙවීම සඳහා විශ්ලේෂණ කටයුතු ආහාර අංශය මඟින් සිදුකරනු ලබයි.

දීපිකා සෙනෙවිරත්න
ආණ්ඩුවේ රස පරීක්ෂක

03
පරිච්ඡේදය

සමස්ථ මූල්‍යමය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒඑසීඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය **2022**		සටහන	තත්‍ය		
			2022	**2021**	
රු.			රු.	රු.	
	- **ආදායම් ලැබීම්**		-	-	
	- ආදායම් බදු	**1**	-	-	**ඒඑසීඒ-1**
	- දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
	- ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු	**3**	-	-	
	- බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
	- **මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
	- **ආදායම් නොවන ලැබීම්**				
	- භාණ්ඩාගාර අග්‍රිම		482,131,000	523,984,000	**ඒඑසීඒ-3**
	- තැන්පතු		484,458	811,251	**ඒඑසීඒ-4**
	- අත්තිකාරම් ගිණුම්		10,185,238	9,719,796	**ඒඑසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
	- **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**492,800,696**	**534,515,048**	
	- **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**492,800,696**	**534,515,048**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**1,523**	**3,965,500**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**492,799,173**	**530,549,548**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
216,655,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	215,122,263	194,013,399	
277,630,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	256,329,827	221,733,958	**ඒඑසීඒ-2(ii)**
1,925,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,754,760	1,782,260	
-	පොළී ගෙවීම්	**8**	-	-	

-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
496,210,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**473,206,849**	**417,529,616**	
	මූලධන වියදම්				
3,450,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	3,137,836	5,036,937	
102,600,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	42,937,521	107,336,015	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
20,000,000	හැකියා වර්ධනය	**14**	11,579,876	27,598,297	
55,000,000	වෙනත් මූලධන වියදම්	**15**	103,935	-	
181,050,000	**මුළු මූලධන වියදම් (උ)**		**57,759,168**	**139,971,249**	
	තැන්පතු ගෙවීම්		436,784	539,569	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		8,932,732	11,029,048	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		9,369,516	11,568,617	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		540,335,534	569,069,483	
677,260,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(47,536,361)	(38,519,935)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(47,536,361)	(38,519,935)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසිඒ-3**

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,556,229,880	2,435,137,992
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	22,459,367	23,691,214
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**2,578,689,247**	**2,458,829,205**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		22,031,247	23,310,767
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,556,229,880	2,435,137,992
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	428,121	380,447
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**2,578,689,247**	**2,458,829,205**

පිටු අංක 09 සිට 24 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 29 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : වසන්තා පෙරේරා
තනතුර : ලේකම්
දිනය : අධිකරණ, බස්තිකාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.
2023.02.28

.....
ගණන්දීමේ නිලධාරි
නම : D. Senevirathne
තනතුර : Government Analyst
දිනය : Government Analyst's Department No. 31, Jauru Mawatha, Pelawatta, Battaramulla.
24/2/23

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ඩබ්බී. පී. ඉරෝෂා උදාසංගනී
ප්‍රධාන ගණකාධිකාරී
ආණ්ඩුවේ රසා පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො.31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල
දිනය : 2023/02/24

3

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ 2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	50,385,780	38,074,016
අග්‍රිම ලැබීම්	482,131,000	523,984,000
අත්තිකාරම් අයකර ගැනීම්	8,760,038	9,766,632
තැන්පතු ලැබීම්	484,458	811,251
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**541,761,277**	**572,635,899**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	476,118,080	420,385,211
සහනාධාර සහ මාරුකිරීම්	1,754,760	1,782,260
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,523	3,965,500
අත්තිකාරම් ගෙවීම්	8,932,732	11,029,048
තැන්පතු ගෙවීම්	436,784	539,569
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**487,243,879**	**437,701,587**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**54,517,397**	**134,934,312**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	54,517,397	134,934,312
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**54,517,397**	**134,934,312**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(54,517,397)**	**(134,934,312)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

වාර්තා කිරීමේ පදනම

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය
   2022 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. පිළියෙල කිරීමේ පදනම
   මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම
   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසලකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම
   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇතිවිට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකිනම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය
   මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ
   2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.01.01	රජයේ ගොඩනැගිලි කුලී	150,000	150,000	409,009	255
20.03.02.99	අනෙකුත් ලැබීම්	10,000,000	10,000,000	36,926,035	369
20.03.99.00	අනෙකුත් ලැබීම්	500,000	550,000	2,046,103	372
20.02.02.99	අනෙකුත් ලැබීම් (පොළිය)	750,000	750,000	968,903	129
20.04.01.00	අනෙකුත් ලැබීම්	-	-	9,758,974	-
20.06.02.02	අනෙකුත් ලැබීම්	-	-	276,755	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

වැය විෂයය	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
	වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
පුනරාවර්තන	496,210,000	496,210,000	473,206,849	95
මූලධන	181,050,000	181,050,000	57,759,168	32
එකතුව	677,260,000	677,260,000	530,966,017	78

3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම

අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය	අරමුණ	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
			වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
අදාළ නැත.						

3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය

වත්කම් කේතය	ජංගම නොවන වත්කම්	භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ 2022.12.31 දිනට ශේෂය	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ 2022.12.31 දිනට ශේෂය	තවමත් ගණන් ගත යුතු	වාර්තා ගත ප්‍රගතිය % ලෙස
9151	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1,100,000,000	1,100,000,000	-	100
9152	2.1 මෝටර් රථ වාහන	102,806,796	102,806,796	-	100
9152	2.2 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1,270,423,084	1,270,423,084	-	100
9153	ඉඩම්	83,000,000	83,000,000	-	100
9154	මූල්‍ය නොවන වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	නොනිමි වැඩ	-	-	-	-
9180	කල්බදු වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } IDO/F/GAD/FS/02/2022 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

ආණ්ඩුවේ රස පරීක්ෂක

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

(අ) සමාලෝචිත වර්ෂය සඳහා භෞතික වත්කම් විකිණීමෙන් ලද මුදල රු.282,355 ක් වුව ද, අවසාන ගිණුම්වලට එය රු.276,755 ක් ලෙස ගලපා තිබුණි.

(ආ) භෞතික වත්කම් විකිණීමෙන් ලද රු.276,755 ක් වූ මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ භෞතික වත්කම් විකිණීමෙන් ලද ආදායම ලෙස දැක්විය යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්වලට මෙම මුදල ඇතුළත් කර තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (ACA 6) සඳහන් මගී වාහනවල වටිනාකම රු.18,654,796 ක් වූ අතර එය 2022 ජනවාරි 01 දිනට රු.90,026,796 ක් ලෙස SA 82 වාර්තාවෙන් ඉදිරියට ගෙනැවිත් තිබුණි. මෙම වෙනසට හේතුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් පැහැදිලිව දක්වා නොතිබුණි.

1.6.3 මූල්‍ය වත්කම්

දෙපාර්තමේන්තුවේ පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂය රු.23,691,214 ක් වූ අතර එම ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 52) අනුව ශේෂය රු.23,711,873 කි. ඒ අනුව ආරම්භක ශේෂ අතර රු.20,659 ක වෙනසක් නිරීක්ෂණය විය. වර්ෂය අවසානයේදී ද මෙම වෙනස දක්නට ලැබෙන අතර මෙය 1996 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එනු ලබන ශේෂ වෙනසක් වන අතර එය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) අනතුරුවලට භාජනය වූ වාහන දෙකකට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) 2003 පෙබරවාරි මස දෙපාර්තමේන්තුවේ සිදු වූ ගින්නෙන් වූ රු.2,229,111 ක අලාභයට අදාළ ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොවුණි.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොකිබීම

දෙපාර්තමේන්තුව විසින් හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කරනු ලැබුව ද, එය යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ චක්‍රලේඛයෙහි 03 (xvii) වගන්තිය අනුව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම්, සාම්ප්‍රදායිකව සිදු කරන පරිදි ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කළ රු.19,200,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරු කිරීමේ ප්‍රතිශතය සියයට 13 සිට සියයට 333 අතර පරාසයක් ගෙන තිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ ලබාගත් ප්‍රතිපාදනවලින් වැය විෂයයන් තුනක සියයට 24 සිට සියයට 68 දක්වා ඉතිරිවීම් පැවතිණි.

(ආ) මූලධන වැය විෂයයක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.5,000,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් තුනක් හා මූලධන වැය විෂයයන් හතරක් වෙනුවෙන් වූ රු.315,555,000 ක ප්‍රතිපාදනයෙන් රු.178,529,489 ක් වැය කිරීමෙන් පසු රු.137,025,511 ක ඉතිරියක් වූ අතර එම ඉතිරිය සියයට 11 සිට සියයට 99 දක්වා පරාසයක් ගෙන තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.613,874 ක් වූ බැරකම් හා බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 94 හි සඳහන් විධිවිධානවලට පටහැනිව මූලධන වැය විෂයයකට අදාළව ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.1,733,847 ක බැරකම්වලට එළඹී තිබුණි.

(ආ) වටිනාකම රු.114,113,636 ක් වූ බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) හා (iv) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති නමුත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් තුළ

ඇත්තේ එකතුව රු.77,378,279 ක් වූ බැඳීම් හා බැරකම් පමණක් බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ බැඳීම් හා බැරකම් රු.36,735,357 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි / ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) අංක CA/1/1/16/1 හා 2010 ජූලි මස 09 දිනැති ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද වක්‍රලේඛය හා 1993/12/31 දිනැති අංක පීපීඒ/6/1/1 දරන ජනාධිපති කාර්යාල වක්‍රලේඛය	නිලධාරීන් දෙදෙනෙකු විසින් වක්‍රලේඛය පරිදි වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) ආයතන සංග්‍රහය	
XV වැනි පරිච්ඡේදයෙහි 10.3 වගන්තිය	දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙකු වක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
(i) මුදල් රෙගුලාසි 104 (4)	වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 1645 (අ)	වාහන 24 කට අදාළ ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 1646	දෙපාර්තමේන්තුවට අයත් වාහන 18 ක් සඳහා ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා ඉදිරිපත්කොට නොතිබුණි.
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	
(i) 5.1 ඡේදය	ඉන්ධන ප්‍රමාණය සහ ධාවනය කරන ලද දුර ප්‍රමාණය ලොග් සටහන් පොතෙහි දිනපතා ඇතුළත් කළ යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි.
(ii) 3.10 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුව ද, එසේ කර නොතිබුණි.
(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 (4) (2) වගන්තිය හා 4 (2) (2) ඡේදය	චක්‍රලේඛය පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

2.5 තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 9.1 (ආ) හා මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අවස්ථා 11 ක දී ලබාගත් රු.329,500 ක අතුරු අග්‍රිම පියවීම දින 21 සිට දින 157 දක්වා කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) අදාළ වියදම නිසියාකාරයෙන් ඇස්තමේන්තු කිරීමකින් තොරව අත්තිකාරම් මුදල් ලබාගෙන තිබූ අතර ඒ අනුව ලබා ගත් මුදල් හා වියදම් කළ මුදල් අතර සියයට 35 සිට සියයට 66 ක පරාසයක ඉතිරිවීම් පැවතුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් වටිනාකම රු.227,303 ක් වූ අතර ඒ තුළ මාස 01 සිට මාස 03 දක්වා වූ හඳුනා නොගත් ලැබීම් රු.35,000 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 සැලැසුම් කිරීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය ප්‍රකාරව සියලුම දෙපාර්තමේන්තු අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර ඇති ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද දිනය සඳහන් කර නොතිබුණු අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

(ආ) යටෝක්ත චක්‍රලේඛයේ 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අන්තර්ගත වී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම මූලධන වියදම් දැරීම සඳහා පමණක් සකස්කර තිබූ අතර ආයතනයේ ප්‍රධාන කාර්යය ඉටුකිරීම සහ අනෙකුත් පුනරාවර්තන වියදම් දැරීම පිළිබඳව ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්ම තුළට ඇතුළත් කර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අංශ 12 ක් සඳහා නඩු 7700 ක් පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා ඉතිරි වී තිබුණු අතර, 2022 වර්ෂයේ දී නවත් නඩු 45245 ක් ලැබී තිබුණි. මින් 2022 වර්ෂය තුළ දී වාර්තා කළ නඩු සංඛ්‍යාව 40756 ක් වන අතර වර්ෂය අවසානයේ විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා නඩු 12189 ක් ඉතිරි වී තිබුණි.

එය 2022 වර්ෂය තුළ පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා තිබූ නඩු සංඛ්‍යාවෙන් සියයට 23 ක් විය.

3.1.3 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සමාලෝචිත වර්ෂය සඳහා සකස්කළ වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනය සඳහා ඉදිරිපත් කළ ද, එය 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

3.2 විදේශ ආධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේ දී කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (KOICA) මගින් දෙපාර්තමේන්තුවේ ධාරිතා වර්ධනය කිරීම සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 4 ක ප්‍රදානයක් ලබා දී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් KOICA ව්‍යාපෘතියෙහි උපදෙස් පරිදි රු.මිලියන 55 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා ඇස්තමේන්තු කර තිබුණද, රු.103,935 ක මුදලක් පමණක් වියදම් ලෙස දරා තිබුණි. KOICA ව්‍යාපෘතිය මගින් සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ගෙවීම් කටයුතු සිදුකරනු ලබන බැවින් මෙම වියදම් දරන ලද කාරණය විගණනයේදී නිරීක්ෂණය නොවීය.

3.3 ප්‍රසම්පාදනයන්

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 (4) (2) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු අතර එහි 4 (2) (2) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි විස්තර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

(අ) අධිකරණ අමාත්‍යාංශයට අයත් වාහන 3 ක් 2020 පෙබරවාරි මස සිටද, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2015 ජූනි මස සිටද, විධිමත් පවරාගැනීමකින් තොරව විගණිත දිනය වූ 2023 මාර්තු 20 දක්වා දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා යොදවා තිබුණි.

(ආ) 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 7 ඡේදය ප්‍රකාරව එක් එක් ආයතනය විසින් මිලදී ගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.42,937,521 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ හා වර්ෂය තුළදී අපහරණය කරන ලද රු.5,997,633 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ පිළිබඳව කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලයට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන්ට ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආඥයේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන් කර තිබුණද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත් කර නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

(අ) වැඩ තහනම් කර ඇති නිලධාරිනියකගෙන් වසර 05 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.18,754 ක ආපදා ණයශේෂය සහ නිලධාරීන් දෙදෙනෙකුගෙන් වසර 02 ත් 03 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.4,800 ක විශේෂ අත්තිකාරම් ණයශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය අතහැර ගොස් ඇති නිලධාරිනියගේ රු.62,549 ක ආපදා ණයශේෂය වසරකට වැඩි කාලයක සිට පැවතිය ද, සමාලෝචිත වර්ෂයේ දී එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ වෙනත් දෙපාර්තමේන්තු වෙත මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.185,633 ක ණයශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 (i) ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තියක් සකස් කොට ක්‍රියාත්මක කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තියක් සකස් කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 (1) සෑම අස්ථිතයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබිය යුතු වුව ද, දෙපාර්තමේන්තුව සඳහා එවැනි කමිටුවක් පිහිටුවා නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) දෙපාර්තමේන්තුවෙහි 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	98	27
තෘතීයික මට්ටම	10	01	09
ද්විතීක මට්ටම	117	93	24
ප්‍රාථමික මට්ටම	84	60	24
එකතුව	336	252	84

(ආ) ආයතනයේ කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට උපකාරී වන තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 27 ක් හා තෘතීයික මට්ටමේ නිලධාරීන් 10 දෙනෙකුගෙන් 9 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු මනා ලෙස හසුරුවා ගැනීමට එය බාධාවක් වී තිබුණි.

මානව සම්පත් සංවර්ධන සැලැස්ම

(අ) 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 (01) ඡේදය ප්‍රකාරව ඇමුණුම 01හි ආකෘතියට අනුව ආයතනයේ සේවය නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 04 හා 05 ඡේද ප්‍රකාරව ඇමුණුම 02 හි ආකෘතියට අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද, මානව සංවර්ධන සැලැස්මක් සකස්කර නොතිබුණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු විය යුතු වුව ද, එසේ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර නොතිබුණි.

(ඈ) ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කළ යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි.

ආර් එස් කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04
පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තු කාර්යසාධන දර්ශක

දර්ශකය	සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස
• වර්ෂය තුළ ඉදිරිපත් වන නඩු භාණ්ඩ/සාම්පල/පරීක්ෂණ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර අවසන් කිරීම.	79%
• පෙර වර්ෂවල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/සාම්පල/පරීක්ෂණ වලට අදාළ විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම.	59%
• අපරාධ ස්ථාන පරීක්ෂාවට අදාළ වාර්තා නියමිත කාලය තුළ නිකුත් කිරීම.	100%
• විද්‍යාගාර 02ක් නවීකරණය කිරීම.	20%
• මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ධාරිතා සංවර්ධනය	70%

05
පරිච්ඡේදය

සුහුරු සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම පිළිබඳ ප්‍රගතිය

අරමුණ	ඉලක්කය	ළඟා කර ගැනීමේ දර්ශක	නිවැරදි දිනට ළඟාකර
සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන 2030 වර්ෂය වන විට නීතිය හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා නඩු භාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත් කරන විද්‍යාත්මක වාර්තා මාස 03ක කාලයක් තුළ ලබාදීමට කටයුතු කිරීම.	තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම.	• වර්ෂය තුළ ඉදිරිපත් වන නඩු භාණ්ඩ/ සාම්පල/පරීක්ෂණ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර අවසන් කිරීම.	79%
		• පෙර වර්ෂ වල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/ සාම්පල /පරීක්ෂණ වලට අදාළ විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම.	59%
		• අපරාධ ස්ථාන පරීක්ෂාවට අදාළ වාර්තා නියමිත කාලය තුළ නිකුත් කිරීම.	100%
		• විද්‍යාගාර 02ක් නවීකරණය කිරීම.	20%
		• මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ධාරිතා සංවර්ධනය	70%

06
පරිච්ඡේදය

මානව සම්පත් කළමනාකරණය හා පරිපාලනය

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය

සේවක කාණ්ඩ මට්ටම	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	100
තෘතීය මට්ටම	10	1
ද්විතීය මට්ටම	116	92
ප්‍රාථමික මට්ටම	84	60
එකතුව	**335**	**253**

6.2 කාර්ය මණ්ඩල ඌනතා හා අතිරික්ත

	තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් ක්ෂේත්‍රය	අනුමත සේවක සංඛ්‍යාව			දැනට සිටින සේවක සංඛ්‍යාව				හිඟ/අතිරික්ත
					ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	වෙනත් (වැඩ බලෙන්)	
1	ආණ්ඩුවේ රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	1	-	-	1	-	-	-	0
2	ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	2	-	-	2	-	-	-	0
3	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක	SLSS	Sp.	SL 3	1	-	-	0	-	-	1	1
4	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	SLSS	I	SL 1	8	-	-	4	-	-	4	4
5	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක	SLSS	I	SL 1	2	-	-	0	-	-	2	2
6	අධ්‍යක්ෂ (පරිපාලන) ශ්‍රී.ල.ප.සේ. I පන්තිය	SLAS	I	SL 1	1	-	-	0	-	-	1	1
7	ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. I පන්තිය	SLAcS	I	SL 1	1	-	-	1	-	-	-	0
8	අභ්‍යන්තර විගණක	SLAcS	II/III	SL 1	1	-	-	0	-	-	1	1
9	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක/සහකාර රස පරීක්ෂක	SLSS	II/III	SL 1	93	-	-	80	-	-	-	13
10	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ පරීක්ෂක/සහකාර පරීක්ෂක	SLSS	II/III	SL 1	14	-	-	12	-	-	-	2
11	ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. III පන්තිය	SLAcS	II/III	SL 1	1	-	-	0	-	-	-	1
	ජ්‍යෙෂ්ඨ මට්ටම එකතුව				**125**	-	-	**100**	-	-	**9**	**25**
12	රසායනාගාර සහකාර සේවය (අධි පන්තිය)	SLTS Supra	Sp.	MN -7	5	-	-	0	-	-	-	5
13	පරිපාලන නිලධාරී	PMAS Supra	Sp.	MN -7	1	-	-	1	-	-	-	0
14	භාෂා පරිවර්තක සේවය	TS	III	MN -6	2	-	-	0	-	-	-	2
15	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය 2 පන්තියේ 11/1 ශ්‍රේණිය	SLICTS	II	MN -6	2	-	-	0	-	-	-	2
	තෘතීය මට්ටම එකතුව				**10**	**0**	**0**	**1**	**0**	**0**	**0**	**9**

16	පර්යේෂණ නිලධාරි	Dept	I/II/III	MN -4	1	-	-	1	-	-	-	0
17	සංවර්ධන නිලධාරි	DOS	I/II/III	MN -4	7	-	-	7	-	-	-	0
18	පුස්තකාලයාධිපති	SLGLS	I/II/III	MN -3	1	-	-	0	-	-	-	1
19	රසායනාගාර සහකාර සේවය	Dept	I/II/III	MN -3	50	-	-	43	-	-	-	7
20	කාර්මික නිලධාරි	Dept	I/II/III	MN -3	1	-	-	0	-	-	-	1
21	කළමනාකරණ සේවා නිලධාරි	MSO	I/II/III	MN -2	36	-	-	27	-	-	-	9
22	යතුරු ලේඛක	Dept	I/II/III	MN -2	10	-	-	9	-	-	-	1
23	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන සහකාර	SLICTS	I/II/III	MT-1	10	-	-	5	-	-	-	5
	ද්විතීය මට්ටම එකතුව				**116**	**0**	**0**	**92**	**0**	**0**	**0**	**24**
25	රියදුරු සේවය	DS	Sp/I/II/ III	PL-3	21	-	-	17	-	-	-	4
26	රසායනාගාර සහායක	Dept	I/II/III	PL-2	12	-	-	3	-	-	-	9
27	ගොඩනැගිලි නඩත්තු සහායක	Dept	I/II/III	PL-2	2	-	-	0	-	-	-	2
28	පුස්තකාල සහායක	Dept	I/II/III	PL-2	1	-	-	1	-	-	-	0
29	කාර්යාල සේවක සේවය	OES	Sp/I/II/ III	PL-1	38	-	-	30	-	-	-	8
30	විද්‍යාගාර ඕඩර්ලි	Dept	I/II/III	PL-1	10	-	-	9	-	-	-	1
	ප්‍රාථමික මට්ටම එකතුව				**84**	**0**	**0**	**60**	**0**	**0**	**0**	**24**
	මුළු එකතුව				**335**	**0**	**0**	**253**	**0**	**0**	**9**	**82**

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු

නිලධාරියාගේ නම	තනතුර	පැවැත්වූ දිනය	පාඨමාලාව
1.ටී. එම්. සී. පී. තෙන්නකෝන් මිය	විද්‍යාගාර ඕර්ඩලි	14.12.2022	Chemical Safety & Risk Management
2.අයි.ඒ.ඩී. සී. මදුමාල් මයා			
3.එච්. ඒ.පී.එච්. හෙට්ටිආරච්චි මිය			
4.එච්.ඩී.සී.එච්. ගුණතිලක මිය			
5.සඳුන් පුෂ්පතරංග මයා			
6.එස්.ඒ.ඒ.බී. පෙරේරා මයා			
7.ආර්.බී.කේ. ප්‍රදීප් චන්දිමාල් මයා			
8.එල්.පී. අජිත් පුෂ්පකුමාර මයා			
9.සාරංග ජයසිංහ මයා	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරි Laboratory Technical Service Officer		
10.බණ්ඩාර ඒකනායක මයා			
11. ඩී.එච්. උදේනි රාජකරුණා මිය			
12.ඩබ්ලිව්.එම්.එන්.එස්. වලිසුන්දර මිය			
13.පී.සී.කේ. සුදසිංහ මයා			
14.එම්.ඩී.සී.ජේ. සුදසිංහ මිය			
15.අයි.ඩී.එන්. මනෝහාරී මිය			
16.ආර්.ආර්.ඩී.ඩී.එම්. රාජපක්ෂ මිය			

නිලධාරියාගේ නම	තනතුර	පැවැත්වූ දිනය	පාඨමාලාව
17.ඩී.ජී. ජයමිණී වාසනා මිය	සංවර්ධන නිලධාරි	06.10.2022, 07.10.2022	අභ්‍යන්තර විගණන හා අභ්‍යන්තර පාලන ක්‍රම වැඩසටහන
18.ආර්.ඩබ්ලිව්.ආර්.කේ. රත්නායක මිය	ජේ. සහකාර රස පරීක්ෂක	03.09.2022	Workplace Health & Safety
19. සී.එන්. කුලසේකර මිය			
20.ඩබ්ලිව්.ඩී.ජී. සේනාරත්න මිය	කළමනාකරණ සේවා නිලධාරි	27.05.2022	විගණන විමසුම් අවම කර ඵලදායී ලෙස පිළිතුරු සැපයීම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු
21.එච්.පී.යූ.කේ. හේවාපතිරණ මයා			
22.පී.ඩී.එම්. ඩිලිනි මෙය	රසායනාර තාක්ෂණ සේවා නිලධාරි		Chemical Safety & Risk Management
23.ඩී.ජී. හේවගේ මිය			
24.ජේ.ටී. ප්‍රනාන්දු මිය			
25.එන්.කේ.ඒ.ජී. විමලකුමාරි මෙය			
26.එච්.ඩබ්.යූ. මදුරංග මයා			
27.ඒ.පී.සී.එන්. අබේවික්‍රම මයා			
28.ඩී.ඒ.පී.ඩී.පී. රණසිංහ මිය			
29.එස්.ඩී.වී.එම්. දිසානායක මිය			
30.ආර්.ඒ.ඩී. දසුනිකා මෙය			
31. ආර්. එස්. මුණසිංහ මයා	කළමනාකරණ සේවා නිලධාරි	14.02.2022	Workshop on Electrical Safety and Safe Use Electricity
32. ඒ.පී. වික්‍රමගේ මයා	කා.කා.ස (නඩත්තු සහකාර)		
33. කේ.එම්.සී. සම්පත් මයා	විද්‍යාගාර ඕර්ඩලි		
34.සී.පී. කුමාරපේලි මිය	ජේ. සහකාර රස පරීක්ෂක	15.03.2022	නවීන තාක්ෂණයෙන් යුත් සෝදිසි කිරීමේ උපකරණ වල තාක්ෂණික ක්‍රියාකාරිත්වය සහ ප්‍රායෝගික පුහුණු වැඩමුළුව
35.යූ.ඩබ්ලිව්.කේ. ප්‍රේමතිලක මයා			
36.ජේ.එම්.පී.අයි. ජයතිලක මිය	සහකාර රස පරීක්ෂක		
37.ඩබ්ලිව්.ඩබ්ලිව්.එච්. වේරගල මයා			
38.අයි.ජී.ඩී. ඉෂානි මිය	සංවර්ධන නිලධාරි	28.04.2022	ගිණුම් කටයුතු ප්‍රවර්ධනය පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුව
39.එච්.ඒ.කේ.එන්. හපුආරච්චි මිය	කළමනාකරණ සේවා නිලධාරි		
40.කේ.වී. කෞෂල්‍යා ශිරෝමණී මෙය	කළමනාකරණ සේවා නිලධාරි	04.05.2022, 05.05.2022	ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම
41.ඩබ්.එස්. විජේබණ්ඩාර මෙය	කළමනාකරණ සේවා නිලධාරි	10.05.2022 – 12.05.2022	සේවාරම්භක පුහුණු වැඩමුළුව Induction Training Workshop
42.ජේ.ඒ.පී.කේ.ටී. කුමාර මයා			
43.එස්.කේ. කුඩච්චි මෙය			
44.වී.එස්. ප්‍රියදර්ශවී මිය	සංවර්ධන නිලධාරි		
45.යූ.එම්. දහනායක මිය	කාර්යාල සේවක සහායක	23.05.2022 – 24.05.2022	Telephone Skills & Etiquette Training Excellent Customer Service

නිලධාරියාගේ නම	තනතුර	පැවැත්වූ දිනය	පාඨමාලාව
46.එල්.එස්. හතුරුසිංහ මිය	ජේ. සහකාර රස පරීක්ෂක	23.04.2022	Workshop on Laboratory System and Performance Improvement
47.එන්. නිසාම් මිය			
48.කේ.පී.ජී.කේ.ටී. ගුරුගේ මිය			
49.පී.එස්. ලියනගේ මිය			
50.එල්.ඒ.ඩබ්.කේ. දහනායක මිය			
51.ඩී.එම්.ජී.සී. බණ්ඩාර මයා			
52.එස්. කුලලි මෙය			
53.ඩබ්ලිව්. ඒ. අයි. ඩී. ප්‍රේමවන්ද්‍ර මෙය	සැකකටයුතු ලේඛන පිළිබඳ ජේ. සහකාර පරීක්ෂක		
54.ජේ.එම්.පී.අයි. ජයතිලක මිය	සහකාර රස පරීක්ෂක		
55.එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය	ජේ. සහකාර රස පරීක්ෂක	28.05.2022	Waste Water Manager
56. අයි.ජේ. අඹේපිටිය			
57. එස්. එම්.වී.ඩී. මාලා මිය			
58. ඩබ්.ජී.ඩී. සේනාරත්න මිය	කළමනාකරණ සේවා නිලධාරි	27.05.2022	How to minimize Audit Queries and answer it satisfactorily
59.එච්.පී.යූ.කේ. හේවාපතිරණ මයා			
60.ඒ.එම්.එන්.එච්. අබේවර්ධන මිය	කළමනාකරණ සේවා නිලධාරි	09.06.2022-10.06.2022	රජයේ නිලධාරින්ට හිමි නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම් පිළිබඳ දෙදින වැඩමුළුව
61.බී.ඩී.වයි.ආර්. විමලරත්න මිය	අධ්‍යක්ෂ (පරිපාලන)	27,28-06.2022	සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම් පිළිබඳ දෙදින වැඩමුළුව
62.ඒ.එම්.සී.ජේ. අධිකාරී මිය	පරිපාලන නිලධාරි	27,28-06.2022	Computation of Civil Pension
63.ඩබ්ලිව්.ජී.ඩී. සේනාරත්න මිය	කළමනාකරණ සේවා නිලධාරි	21,22.06.2022	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය පිළිබඳ වැඩමුළුව Workshop on Annual Commodity Survey & Asset Utilization
64. එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය	ජේ. සහකාර රස පරීක්ෂක	13.06.2022	Certificate Course on Corporate Environmental Sustainability through Greening the Industries
65.ආර්.එස්. මුණසිංහ මයා	කළමනාකරණ සේවා නිලධාරි	27.06.2022	Operation and Preventive Maintenance of Diesel Generators
66. ඒ. පී. වික්‍රමගේ මයා	කා.කා.ස (නඩත්තු සහකාර)		
67. කේ.එම්.සී. සම්පත් මයා	විද්‍යාගාර ඕර්ඩලි		
68. සී. පී. වැලිකල මයා	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	29.06.2022, 30.06.2022	තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම පිළිබඳ වැඩමුළුව Workshop on IT Procurement & Evaluation

විදේශීය පුහුණු/ ශිෂ්‍යත්ව

නිලධාරියාගේ නම හා තනතුර	රට	කාල සීමාව	පුහුණුව
ඩබ්ලිව්. එම්.පී.බී.කේ. වර්ණසූරිය ජේ.ස.ර.පරීක්ෂක	තායිලන්තය	දෙසැම්බර් 2022- ඔක්තෝබර් 2024	Programme Msc. In Food Science and Technology
සී. එන්. කුලසේකර මිය ජේ.ස.ර.පරීක්ෂක	ඉන්දියාව	29.11.2022- 11.12.2022	ITEC – Advanced Analytical Techniques, Basic Principles and Application for Quantity Assessment of Drugs and Pharmaceutical Education and Pharmaceuticals
ඩබ්ලිව්. ඩබ්ලිව්. එච්. වේරගල සහකාර රස පරීක්ෂක		12.12.2022- 17.12.2022	ITEC – Narcotic Substances and Enforcement of Drug Laws

China Multi Lateral Programmes (Online)

නිලධාරියාගේ නම	තනතුර	සම්මන්ත්‍රණය
කේ. ඩී. ඩබ්ලිව්. පංචමී මිය	සහකාර රස පරීක්ෂක	Seminar on Import & Export food Inspectionand Food Safety for Officials of developing countries.
ඩබ්ලිව්. එස්. එස්. ගුණවර්ධන මිය	රසායනාගාර තාක්ෂණ නිලධාරි	Seminar on Capacity Building for Young Officials from developing countries.
ඩී. ජී. ජේ.ජේ. වාසනා මිය	සංවර්ධන නිලධාරි	Seminar on Capacity Building for female officials from developing countries
සී. පී. වැලිකල මයා	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	Seminar on Management and Application of government big data in the cloud environment

KOICA Following Local Training

ඩිජිටල් අංශය

ඩබ්ලිව්. ඒ. අයි. ඩී. ප්‍රේමවන්ද්‍ර	සැකකටයුතු ලේඛන පි.ආණ්ඩුවේ ජේ.ස.ර.ප	08.11.2022-12.11.2022
එස්. කේ. එන්. සඳගිරි	සැකකටයුතු ලේඛන පි.ආණ්ඩුවේ ජේ.ස.ර.ප	08.11.2022-12.11.2022
ඩබ්ලිව්. ජී. ඩී. එල්. ගුණතිලක	සැකකටයුතු ලේඛන පි.ආණ්ඩුවේ ජේ.ස.ර.ප	08.11.2022-12.11.2022
ඊ. එම්. ඩී. ටී. ඊ. උඩංගමුව	සැකකටයුතු ලේඛන පි.ආණ්ඩුවේ ජේ.ස.ර.ප	08.11.2022-12.11.2022
ඒ. එම්. එන්. ඩී. චන්ද්‍රවංශ	සැකකටයුතු ලේඛන පි.ආණ්ඩුවේ ජේ.ස.ර.ප	08.11.2022-12.11.2022
පී. ඒ. වයි. සමන්මලී	සැකකටයුතු ලේඛන පි.ආණ්ඩුවේ ස. ර. ප	08.11.2022-12.11.2022

නිලධාරියාගේ නම	තනතුර	සම්මන්ත්‍රණය
ඩීඑන්ඒ අංශය		
ආර්. ඩබ්. ආර්. කේ. රත්නායක	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
පී. ජී. ද සිල්වා	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ආර්. ඒ. බී. එස්. රණසිංහ	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ඊ. මාරසිංහ	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
යූ. ජී. එස්. ටී. ගමගේ	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ආර්. එම්. එල්. එස්. රත්නායක	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
කේ. එම්. ඩී. එස්. සුබසිල	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ධූලක විද්‍යා අංශය		
එල්. එස්. හතුරුසිංහ	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එස්. එල්. ආර්. ගුණවර්ධන	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ටී. ආර්. එම්. සී. දිල්හානි මැණිකේ	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එස්. එල්. මදුනිල්	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එච්. ටී. ටී. ප්‍රියදර්ශනී	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
පී. ජී. පී. චන්ද්‍රසිරි	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
සී. එන්. කුලසේකර	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
වයි. එච්. මදුරාවෙල	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ඊ. ජී. ආර්. තක්ෂිලා	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
මත්ද්‍රව්‍ය අංශය		
කේ. ඒ. ඩී. සී. කොඩිතුවක්කු	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
කේ. වී. රත්නපාල	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
යූ.එල්. කත්‍රිආරච්චි	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ඊ. ජී. එල්. උමගිලියගේ	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
වී. එස්. ජයසේකර	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
සී. පී. කුමාරපේලි	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එම්. ඒ. ජේ. ප්‍රනාන්දු	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ඒ. එස්. සපුතන්ත්‍රී	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
යූ. ඩබ්ලිව්. එස්. ප්‍රේමතිලක	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
සී. කේ. බණ්ඩාර	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ජේ. එම්. පී. අයි. ජයතිලක	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එච්. එන්. ඒ. පෙරේරා	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එන්. එන්. බර්නාඩ්	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ඩබ්ලිව්. ඩබ්ලිව්.එච්. වේරගල	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
පී. පී. මලලසේකර	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022

නිලධාරියාගේ නම	තනතුර	සම්මන්ත්‍රණය
ගිනි සහ ගිනි තැබීම් ස්ථාන විමර්ශනය		
ඩබ්ලිව්. ඒ. ආර්. ප්‍රනාන්දු	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
පී.එස්. ලියනගේ	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
අයි.එච්. කුලතුංග	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එම්.ඊ.ජේ. සෙනෙවිරත්න	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ටී.එම්.පී.ජී.සී.ආර්. සෙනෙවිරත්න	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එම්.එම්. සුසන්ත ප්‍රේමලාල්	පර්යේෂණ නිලධාරි	08.11.2022-12.11.2022
එන්.අයි. කේ. ප්‍රනාන්දු	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
එල්.ඒ ඩබ්ලිව්.කේ. දහනායක	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ඒ.සී. එස්. ධර්මරත්න	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ඒ.ආර්.ඩී. බණ්ඩාර	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
රථ වාහන අනතුරු විශ්ලේෂණය		
වයි.එම්.ඩබ්ලිව්.එස්. බණ්ඩාර	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
ඩී.එම්.ජී.සී. බණ්ඩාර	ජේ. සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022
සී.ඩී. පරණගම	සහකාර රස පරීක්ෂක	08.11.2022-12.11.2022

07
පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
1	නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන/ගිණුම් ඉදිරිපත් කර තිබුණේද?			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	ඔව්		
1.2	රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම	ඔව්		
1.3	වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නැත		
1.6	වෙනත් - පොදු තැන්පත් ගිණුම	ඔව්		
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම			
2.1	2018.11.21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය	ඔව්		
2.2	පුද්ගල පඩි නඩි ලේඛනය/පුද්ගල පඩි නඩි කාඩ්පත්	ඔව්		
2.3	විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.4	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.5	සිගාස් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කර මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන්නේද?	ඔව්		
2.6	ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය	ඔව්		
2.7	බඩු ලේඛන පොත	ඔව්		
2.8	තොග පොත	ඔව්		
2.9	හානි පිළිබඳ ලේඛනය	ඔව්		
2.10	බැරකම් ලේඛනය	ඔව්		
2.11	චෙක්පත් උප පත්‍රිකා ලේඛනය	ඔව්		
3	මූල්‍ය බලතල පැවරීම			
3.1	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදුකර තිබේද?	ඔව්		
3.2	මූල්‍ය බලතල පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර තිබේද?	ඔව්		
3.3	එම මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා තිබුණේද?	ඔව්		
3.4	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන් විසින් පහත සඳහන් පාලන ක්‍රම අනුගමනය කර තිබේද?	ඔව්		

අංකය	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
4	වාර්ෂික සැලසුම් පිළියෙල කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණේද?	ඔව්		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේද?	ඔව්		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබේද?	ඔව්		
4.4	ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර තිබේද?	ඔව්		
4.5	වර්ෂය ආරම්භයේදී එක් එක් මාසයට අදාළව අවශ්‍ය වන මුදල් අවශ්‍යතාවය ඇතුළත් මුදල් ප්‍රවාහය සැලසුම් කර එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළේද?	ඔව්		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියලුම විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළ දී පිළිතුරු ඉදිරිපත් කර තිබේද?/විගණන විමසුම් නොතිබුණේද?	අදාළ නැත		
6	අභ්‍යන්තර විගණනය			
6.1	සියලුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර තිබුණේද? අභ්‍යන්තර විගණන විමසුම් නොතිබුණේද?	ඔව්		
6.2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	ඔව්		
6.3	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	ඔව්		
6.4	මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කරන ලද්දේද?	අදාළ නැත		
7	විගණන හා කළමනාකරණ කමිටුව			
7.1	විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට 04ක් හෝ පවත්වා තිබුණේද? සහභාගී වී තිබුණේද?	අමත්‍යාංශයේ පැවැති රැස්වීම් 03ක් සඳහා සම්බන්ධ වී ඇත.		
8	වත්කම් කළමනාකරණය			
8.1	2017.07.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද්දේද?	ඔව්		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත් කර ඒ බව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට දන්වා යවන ලද්දේද?	ඔව්		
8.3	2016.03.31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළේද?	ඔව්		

අංකය	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ වක්‍රලේඛයේ සඳහන් කාල වකවානු තුළ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුවී නොතිබුණේද?	ඔව්		
8.5	මු.රෙ 772 අනුව අබලි ද්‍රව්‍ය අපහරණය කර තිබේද?	ඔව්		
9	වාහන පාලනය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද?	ඔව්		
9.2	වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කරනු ලබන්නේද? එවැනි වාහන නොතිබුණේද?	ඔව්		
9.3	සෑම වාහනයක් සඳහාම වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර තිබේද?	ඔව්		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබේද? එසේ අනතුරු සිදුවී නොතිබුණේද?	ඔව්		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර තිබේද?	ඔව්		
9.6	ලීසිං වාරික ගෙවා අවසන් වාහනවල පරම අයිතිය පවරාගෙන තිබුණේද?	ඔව්		
10	බැංකු ගිණුම් ප්‍රකාශය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා සූදානම් කර තිබුණේද?	ඔව්		
10.2	සමාලෝචන වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබුණු අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කළේද? එවැනි ගිණුම් නොතිබුණේද?	ඔව්		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබුණු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කර එම ශේෂ මාසයක් ඇතුළත නිරවුල් කර තිබුණේද?/එවැනි ගැලපුම් නොතිබුණේද?	ඔව්		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	වැය විෂයකට හෝ ව්‍යාපෘතියකට හෝ වැඩසටහනකට හෝ ශීර්ෂයකට සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කර තිබුණේද?	ඔව්		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණේද? එවැනි බැරකම් වලට එළඹ නොතිබුණේද?	ඔව්		
12	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිනුම			
12.1	අදාළ අත්තිකාරම් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණේද? /පාර්ලිමේන්තුව විසින් අත්තිකාරම් කාර්යයක් පවරා තිබුණේද?	ඔව්		
12.2	හිඟහිටි ණය ශේෂවල කාල විශ්ලේෂණයක් පිළියෙල කර තිබුණේද? එවැනි ශේෂ නොතිබුණේද?	ඔව්		
12.3	වර්ෂ 1කට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබුණේද? එවැනි හිඟහිටි ශේෂ නොතිබුණේද?	නැත	රු.18,754/- ක ණය ශේෂය නඩු තීන්දුවෙන් පසුව නිරවුල් කරනු ඇත. රු. 4,800/- ක ණය ශේෂයන් සඳහා ගෙවීම් කරන ලෙස අදාළ නිලධාරීන්ට දන්වා ඇත.	

අංකය	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබුණේද? එවැනි තැන්පතු නොතිබුණේද?	ඔව්		
13.2	පොදු තැන්පත් ලේඛනය නඩත්තු කරමින් පවතීද?	ඔව්		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළේද?	ඔව්		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කළේද? එසේ අග්‍රිම නිකුත් නොකළේද?	ඔව්		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබුණේද?	ඔව්		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා අනාවරණය වූ වෙනස්කම් මාසිකව සසඳා තිබුණේද?	ඔව්		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ විධිවිධාන වලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවා තිබුණේද?/ එසේ ආදායම් ආපසු ගෙවා නොතිබුණේද?	ඔව්		
15.2	රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැරකර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැරකර හෝ තිබුණේද? එවැනි ආදායම් නොතිබුණේද?	ඔව්		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේද?	ඔව්		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය අනුයුක්ත කර/බඳවා ගෙන තිබේද?	නැත		
16.2	කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත ලිඛිත කාර්යය පැවරුම් කර තිබේද?	ඔව්		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යෑම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මිය යාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්යය මණ්ඩලය වෙනස් වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්යය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණේද?	ඔව්		
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව මහජනයා වෙත අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු ලබාදීම සඳහා වගකිව යුතු නිලධාරියෙක් පත්කර තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?	ඔව්		
17.2	මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීම, ලේඛන ගත කිරීමට ඒම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය දැක්වෙන ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?	ඔව්		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන ඡේදවලට අනුකූලව අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව වාර්තා ඉදිරිපත් කර තිබේද?	ඔව්		

අංකය	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	2018.01.24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන් හඳුන්වා දී ඇති පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය ක්‍රියාත්මක කර තිබේද?	ඔව්		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගයීම සඳහා අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද?	ඔව්		
19	මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම			
19.1	2018.01.24 දිනැති අංක 02/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර තිබේද?	ඔව්	-	
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ සහතික කර තිබේද?	ඔව්		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබේද?	නැත	කාර්ය සාධන ගිවිසුම සකස් කරමින් පවතී.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කරන ලද්දේද?	ඔව්		
20	විගණන ඡේද			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත්කළ විගණන ඡේද වලින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි කර තිබුණේද? එවැනි විගණන ඡේද නොතිබුණේද?	ඔව්		